# රණවිරුවා

2023 සැප්තැම්බර් • 259 කලාපය



74 වන
සංවත්සරය
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
1949 - 2023

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර



# නව කෘතීන් ද්විත්වයක් එළිදැක්වේ.












ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) විසින් රචනා කරනු ලැබූ "තාරාගේ ආගමනය" (*Thaarage Aagamanaya*) කෘතිය සහ "කඩොල් ඇත්තු" (*Kadol Eththu*) කෘතියේ ඉංග්‍රීසි පිටපත ඉකුත් සැප්තැම්බර් මස 07 වන දින කොළඹ ආනන්ද විද්‍යාල පරිශ්‍රයේ පැවති උත්සවයකදී එළිදැක්විණ. එහිදී, නව කෘතීන්හි මංගල පිටපත් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන් සහ ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමන් වෙත පිළිගැන්විය.

රණවිරුවන්ගේ අමරණීය මතකයන්ට උපහාරයක් වශයෙන් කර්තෘවරයාගේ සුරතින් දිවංගත ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ගේ භාර්යාව වන ලලී කොබ්බෑකඩුව මහත්මිය සහ දිවංගත මේජර් ජෙනරාල් විජය විමලරත්න ගේ භාර්යාව වන මානෙල් විමලරත්න මහත්මිය වෙත, නව කෘතීන්හි පිටපත් ප්‍රදානය කරනු ලැබිය. "තාරාගේ ආගමනය" සහ "කඩොල් ඇත්තු" නව කෘතීන් එළිදැක්වීමේ උත්සව අවස්ථාව සඳහා මහා සංඝරත්නය, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, විදේශ තානාපතිවරු, යුද්ධ හමුදාධිපති, කොළඹ ආනන්ද විද්‍යාලයේ විදුහල්පති ඇතුළු ආරාධිතයින් රැසක් සහභාගී වූහ.

# ආරක්ෂක රාජ්‍ය ඇමති මුලතිව් ප්‍රදේශයේ සංචාරයක

ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමන් ඉකුත් සැප්තැම්බර් 04 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) හි සංචාරයක නිරත විය. එහි ආඥාපති මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ගේ පිළිගැනුම් මධ්‍යයේ සපැමිණි අමාත්‍ය තුමන් එම මූලස්ථානයේ රාජකාරී නියුතු හටපිරිස් අමතන්නටද අමතක නොකළේය.

සිය සංචාරය තුළදී රාජ්‍ය අමාත්‍යවරයා ඇතුළු පිරිස බලඇණි පුහුණු පාසල - නන්දිකඩාල් වෙතද පැමිණියේය. එම පුහුණු පාසල මුලතිව් දිස්ත්‍රික්කයේ ශිෂ්‍යභට බලකා පුහුණු පාසලක් ලෙස ස්ථාපනය කිරීම සඳහා වන ලිපිය එහිදී ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති විසින් ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා හට සංකේතාත්මකව භාරදුන් අතර, අනතුරුව අමාත්‍යවරයා විසින් එම ලිපිය ජාතික ශිෂ්‍යභට බලකා අධ්‍යක්ෂ වෙත භාරදීමට කටයුතු කරන ලදී.











# යුද්ධ හමුදාධිපති පොලිස් සේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සංචාරයක

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සිය ධුරයට පත්වීමෙන් පසු පොල්හේන්ගොඩ ස්ථාපිත ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත ඉකුත් සැප්තැම්බර් මස 01 වන දින සිය ප්‍රථම නිල සංචාරය සිදුකළේය. එහිදී, කඳවුරු පරිශ්‍රය වෙත සපැමිණි යුද්ධ හමුදාධිපති වෙත යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ හටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ ගෞරවාචාරය පිරිනැමීමෙන් අනතුරුව යුද්ධ හමුදා විනයාරක්ෂාධිපති සහ යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඊසීඒ ද සොයිසා යූඑස්පී එන්ඩීඑම්සී එල්එස්සී විසින් එතුමන් උණුසුම් අයුරින් පිළිගනු ලැබීය.









එම සංචාරයේදී රෙජිමේන්තු පරිශ්‍රයේ ඉදිකර තිබූ හමුදා ඉතිහාසයේ විප්ලවීය වෙනසක් සිදුකළ මෙන්ම "හොඳ හමුදාවක් පැවතීමට නම් හොඳ හමුදා පොලිසියක් තිබිය යුතුය" යන සංකල්පයෙන් යුද හමුදා පොලිසිය ලොවට හඳුන්වාදුන් ප්‍රංශයේ හිටපු අධිරාජයකු වූ නැපෝලියන් බොනපාට්ගේ පිළිරුවක් විවෘත කිරීමද බලලත් නිලධාරී සහ සැරයන් නිවස්නය සඳහා නව දෙමහල් ගොඩනැගිල්ලක් සහ නව භෝජනාගාරයක් ඉදිකිරීම වෙනුවෙන් මුල්ගල් තැබීමද යුද්ධ හමුදාධිපති ගේ සුරතින් සිදුවිය. එහිදී, සියලු නිලයන් ආමන්ත්‍රණය කළ යුද්ධ හමුදාධිපති යුද්ධ හමුදාවේ විනය ඉහළ මට්ටමකින් පවත්වාගැනීම සඳහා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ හවුපිරිස්හි නිරන්තර කැපවීම ඇගයීමටද ලක්කළේය. එසේම යුද්ධ හමුදාවේ උන්නතිය උදෙසා එම කටයුතු ඉදිරියටද ඒ ආකාරයෙන්ම අඛණ්ඩව සිදුකරගෙන යාමේ වැදගත්කමද පෙන්වා දෙන ලදී.

# යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ විශිෂ්ටයින්ට වර්ණ ප්‍රදානය කෙරේ





ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ අභිමානය ඉහළ නැංවීම වෙනුවෙන් කැපීපෙනෙන දායකත්වයක් දැක්වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීමට ලක්කිරීමේ අරමුණින් ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව් තුලින් සුවිශේෂී දක්ෂතා දැක්වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත වර්ණ ප්‍රදානය කිරීම වෙනුවෙන් "යුද්ධ හමුදා පොලිස් හේවා බලකා වර්ණ රාත්‍රිය - 2023" ඉකුත් සැප්තැම්බර් මස 01 වන දින සන්ධ්‍යාවේ ජනමාධ්‍ය අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

යුද්ධ හමුදා විනයාරක්ෂාධිපති සහ යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ බලකාධිපතිගේ ආරාධනයෙන් එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති සහභාගී විය. මෙම වර්ණ ප්‍රදාන උත්සවයේදී වර්ෂ 2012 සිට 2023 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට සහ මව්බිමට කීර්තියක් අත්කර දෙමින් ක්‍රීඩා ඉසව් 22 ක් නියෝජනය කරමින් ජයග්‍රහණ හිමිකරගත් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ වර්ණ හිමිකර ගත්හ.

යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ඇතුළු පිරිසක්ද මෙම අවස්ථාවට සහභාගී වූහ. යුද්ධ හමුදාධිපති විසින් මෙම අවස්ථාවේදී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් තවදුරටත් දිරිගැන්වීමේ අරමුණින් ඔවුන්ගේ ක්‍රීඩා කුසලතා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය වෙත රුපියල් මිලියනයක මූල්‍ය දිරිගැන්වීමක් ද සිදුකළේය.



# ශ්‍රී ලංකා යුද්ධ හමුදා හටකාර්ය සම්පාදක අණසක මූලස්ථානයේ නව වෙබ් පිටුව සහ 'Trade Test Management System' මෘදුකාංග යෙදවුම එළිදැක්වේ

ශ්‍රී ලංකා යුද්ධ හමුදා හටකාර්ය සම්පාදක අණසක මූලස්ථානය වෙතින් හඳුන්වාදෙනු ලබන 'Trade Test Management System' යෙදවුම එළිදැක්වීම පසුගිය සැප්තැම්බර් මස 05 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් යුද හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් හා යුද්ධ හමුදා හටකාර්ය සම්පාදක අණසක මූලස්ථානයේ ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ගේ මඟපෙන්වීම මත තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ තාක්ෂණික නිලධාරීන් විසින් කෙටි කාලසීමාවක් තුළ මෙම නව වෙබ් පිටුව සහ 'Trade Test Management System' මෘදුකාංග යෙදවුම සැලසුම් කරනු ලැබීය. මේ තුළින් හටකාර්ය සම්පාදක අණසක මූලස්ථානයේ ඉතිහාසය, අණ, පුහුණු සහ සම්මන්ත්‍රණ, සබඳතා සහ අනෙකුත් සියලු විස්තර පිළිබඳ දැනුවත්වීමේ හැකියාව පවතී.



යුද්ධ හමුදාවේ සියලුම රෙජිමේන්තු වෙත හඳුන්වාදෙනු ලබන මෙම 'Trade Test Management System' මෘදුකාංග පද්ධතිය තුළින් සියලුම යුද්ධ හමුදා රෙජිමේන්තුවලට අදාළ වෘත්තීය පුහුණු පරීක්ෂණ වාර්තා පවත්වාගැනීම සහ එම තොරතුරු යාවත්කාලීන කිරීම මෙන්ම යුද්ධ හමුදාවේ සියලුම සාමාජිකයන්ට ඔවුන්ගේ වෘත්තියට අදාළ විස්තර වාර්තාවන් ලබාගැනීමේ හැකියාව ද හිමිවේ. යුද්ධ හමුදාව තුළ පවතින විවිධ වූ හටකාර්ය සම්පාදක කටයුතු පහසුවෙන් කළමනාකරණය කරගැනීම සඳහා මෙම නව තාක්ෂණික යෙදවුම බෙහෙවින් උපකාරී වේ.



# "රාජකීය පොදුරාජ්‍ය මණ්ඩලීය සේවා මුක්ත හට සංගම් ලීගය" මෙහෙයවූ සම්මන්ත්‍රණයේ ප්‍රධාන ආරාධිත අමුත්තා යුද්ධ හමුදාධිපති






රාජකීය පොදුරාජ්‍ය මණ්ඩලීය සේවා මුක්ත හට සංගම් ලීගය (Royal Commonwealth Ex-Services League') මගින් සංවිධානය කරන ලද ආරක්ෂාව සහ පාලනය පිළිබඳව සම්මන්ත්‍රණයේ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය කොළඹ, සිනමන් ලේක්සයිඩ් හෝටලයේදී පසුගිය සැප්තැම්බර් මස 14 දින පැවැත්වූ අතර, එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය.

එක්සත් රාජධානියේ රාජකීය පොදුරාජ්‍ය මණ්ඩලීය හිටපු සේවා මුක්ත හට සංගමයේ නියෝජිත නිලධාරීන් විසින් මෙම සම්මන්ත්‍රණය මෙහෙයවන ලද අතර, මෙරට සේවා මුක්ත හට සංගමය විසින් එය සංවිධානය කරන ලදී. මෙම දෙදින සම්මන්ත්‍රණය සඳහා ආසියාතු සහ අප්‍රිකානු කලාපයේ රටවල් 10ක් නියෝජනය කරමින් එම රටවල සේවා මුක්ත හට සංගම් නිලධාරීහු සහභාගී වූහ.

රාජකීය පොදුරාජ්‍ය මණ්ඩලීය සේවා මුක්ත හට සංගම් ලීගය මගින් කලක් බ්‍රිතාන්‍ය කිරීටය යටතේ සේවය කළ සහ විදේශයන්හි පදිංචිව සිටින පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල හිටපු හමුදා සෙබළුන් සහ කාන්තාවන් සඳහා සුබසාධන ආධාර ලබාදීම සිදුකරනු ලබයි.



වර්ෂ 1951 දී අර්ල් හේග් (Earl Haig) විසින් රාජකීය පොදුරාජ්‍ය මණ්ඩලීය සේවා මුක්ත හට සංගම් ලීගය ආරම්භ කරන ලද අතර, මෙම සංවිධානයේ දැනට රටවල් 46 ක සංවිධාන 52 ක් සාමාජිකත්වය දරයි. කැරිබියන්, බටහිර, නැගෙනහිර සහ දකුණු අප්‍රිකාව, අග්නිදිග ආසියාව, පැසිෆික් සහ දකුණු ශාන්තිකර දූපත් ආවරණය කරමින් මෙම සංවිධානය කටයුතු කරයි. රාජකීය පොදුරාජ්‍ය මණ්ඩලීය සේවා මුක්ත හට සංගම් ලීගය මගින් දිනකට සමාන ආහාර වේල් දෙකක දීමනාවක් සැපයීම වැනි සුභසාධන කටයුතු සිදුකරන අතර, එහි ප්‍රධාන පරමාර්ථය වන්නේ අවශ්‍යතා සහිත හිටපු හමුදා සෙබළුන් හා කාන්තාවන් සඳහා උපකාර කිරීමයි.



# ශ්‍රී ලංකාවේ නවසීලන්ත මහ කොමසාරිස් යුද්ධ හමුදාධිපති හමුවෙයි





ශ්‍රී ලංකාවේ නවසීලන්ත මහ කොමසාරිස් මයිකල් ඇපල්ටන් (*Michael Appleton*) මහතා ඉකුත් සැප්තැම්බර් 06 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවිය.

මෙම හමුවේදී, දෙරටට අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වන කරුණු පිළිබඳවත්, දෙරට අතර පවතින සුහදතාවය, සහයෝගීතාවය මෙන්ම ද්විපාර්ශ්වික සබඳතාවයේ දිගුකාලීන බැඳීම් පිළිබඳව සාකච්ඡා කළ අතර, එම සබඳතාවන් වැඩිදියුණු කිරීමේ වැදගත්කම පිළිබඳව ද අදහස් හුවමාරු කරගන්නා ලදී.

# කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති යුද්ධ හමුදාධිපති හමුවෙයි





කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අභිනවයෙන් පත් වූ උපකුලපති රියර් අද්මිරාල් එච්.ජී.යූ දම්මික කුමාර වීඑස්වී යූඑස්පී පීඑස්සී MMaritimePol BSc (DS) ඉකුත් සැප්තැම්බර් 14 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවිය. මෙම සුහද හමුවේදී නව උපකුලපතිවරයා වෙත සිය සුභ පැතුම් පිරිනැමූ යුද්ධ හමුදාධිපති කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ දැනට පවතින පුහුණු මොඩියුල සහ යෝජිත අධ්‍යයන කටයුතුවල ප්‍රගතිය පිළිබඳවද සාකච්ඡා කරන ලදී.

# ශ්‍රී ලංකාවේ පාකිස්ථාන මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවෙයි





ශ්‍රී ලංකාවේ පාකිස්ථාන මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කර්නල් මුහම්මද් ෆාරූක් පීඑස්සී (*Colonel Muhammad Farooq psc*) ඉකුත් සැප්තැම්බර් මස 04 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය. මෙම සුහද හමුවේදී, දෙරටෙහි යුද්ධ හමුදාවන් අතර පවතින සුහදතාවය, සහයෝගීතාවය මෙන්ම ද්විපාර්ශ්වික සබඳතාවය ඇතුළු පොදු කරුණු පිළිබඳ සාකච්ඡා කෙරිණි.

# ධුරයෙන් නික්ම යන ශ්‍රී ලංකාවේ බංගලාදේශ මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක, යුද්ධ හමුදාධිපති හමුවෙයි





ශ්‍රී ලංකාවේ බංගලාදේශ මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කොමඩෝරු එම්.ඩී. ශෆියුල් හාරි (එන්ඩී) පීඑස්සී බීඑන් පසුගිය සැප්තැම්බර් 22 වන දින උදෑසන යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී යුද්ධ හමුදාධිපති හමුවිය.

මෙම සුහද හමුවේදී, ධුරයෙන් නික්ම යන කොමඩෝරු එම්.ඩී. ශෆියුල් හාරි (එන්ඩී) පීඑස්සී බීඑන් ශ්‍රී ලංකාව තුළ සේවයේ නියුතු කාලසීමාව තුළදී ඔහු වෙත ලබාදුන් සහයෝගීතාවය සහ සුහදතාවය වෙනුවෙන් යුද්ධ හමුදාධිපති වෙත සිය කෘතඥතාව පුදකළේය. බංගලාදේශය සහ ශ්‍රී ලංකාව අතර දිගුකාලීන සබඳතා පිළිබඳ සිහිපත් කරමින් එම බැඳීම් තවදුරටත් පවත්වාගැනීමේ වැදගත්කම පිළිබඳවද ඔවුහු එහිදී සාකච්ඡා කළහ. මෙම සුහද හමුවේ සමාප්තිය සනිටුහන් කරමින් සමරු තිළිණ හුවමාරුවක් ද සිදුකෙරිණි.



# ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංවත්සර සැමරුමට ආගමික ආශීර්වාද එක් කරමින්



ඔක්තෝබර් මස 10 දිනට යෙදී ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 74 වන සංවත්සරයට සමගාමීව පැවැත්වූ ආගමික සැමරුම් මාලාවේ දෙවැන්න මහනුවර ශ්‍රී දළදා මාලිගාවේදී ඉකුත් සැප්තැම්බර් මස 28 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

"ජාතියේ ආරක්ෂකයින්" ලෙස ඉමහත් ප්‍රශංසාවට සහ ගෞරවාදරයට පත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බලසේනාව, සියලුම ආරක්ෂක සේනා මූලස්ථාන, ඉදිරි නඩත්තු පෙදෙස, සේනාංක, බලසේනා, සියලුම රෙජිමේන්තු, පුහුණු මධ්‍යස්ථාන සහ දිවයින පුරා ස්ථාපිත ඒකක නියෝජනය කරමින් වර්ණවත් ධජ රැගත් යුද්ධ හමුදාධිපති ප්‍රමුඛ නිලධාරීන් සහ කොමිෂන් නොලත් නිලධාරීන් මහත් අභිමානයෙන් හා ගෞරවයෙන් යුතුව ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයේ එම කටයුත්ත සඳහා එක්වූහ.

එහිදී, යුද්ධ හමුදාධිපති විසින් ශ්‍රී දළදා මාලිගාවේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැල බණ්ඩාර මහතා වෙත සංකේතාත්මකව මූල්‍ය පරිත්‍යාගයක්ද සිදුකරනු ලැබීය. මෙම ආශීර්වාද පූජාව සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය ද සහභාගී වූවාය.











74 වන යුද්ධ හමුදා සංවත්සර සැමරුමට සමගාමීව සිදුකරනු ලබන ආගමික ආශිර්වාද ලබාගැනීමේ වැඩසටහන් මාලාවේ තවත් අදියරක් අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියසදී පසුගිය සැප්තැම්බර් මස 27 වන දින පැවැත්විණි. යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනේදී යුද හමුදාවේ සියලුම අංග, ආයතන නියෝජනය වන පරිදි ධජ ආශිර්වාද පිණිස එක්කරන ලදී.

එහිදී ධජ රැගත් එම යුද්ධ හමුදා සාමාජිකයින් ජය ශ්‍රී මහා බෝධියේ පහල වැලි මළුව වටා තෙවරක් පැදකුණු කොට මැද මළුවේදී එම ධජයන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත භාරදුන්හ. ඉන් පසුව යුද්ධ හමුදාධිපති ප්‍රමුඛ පිරිස බැතිබරව එම ධජ ජය ශ්‍රී මහා බෝ සමිඳුන් වටා තැන්පත් කරන ලදී.

මෙහිදී, ආගමික වතාවත් සිදුකර ආශිර්වාද එක් කිරීම සඳහා රුවන්වැලිසෑය විහාරාධිපති පූජ්‍ය ඊතලවැටුණුවැවේ ඥාණතිලක හිමි, මිරිසවැටිය විහාරාධිපති වැලිහේනේ සෝභිත හිමි, ථූපාරාමාධිපති පූජ්‍ය කහල්ලේ ඥාණරතන හිමි, අභයගිරිය විහාරාධිපති ආචාර්ය කල්ලංච්චියේ රතන හිමි, ශ්‍රී ජයන්ති විහාරාධිපති පූජ්‍ය නුගතැන්නේ පඤ්ඤානන්ද නායක හිමි ඇතුළු විහාරස්ථාන නියෝජනය කරමින් මහා සංඝරත්නය වැඩම කරනු ලැබූහ. එම අවස්ථාවේදී යුද්ධ හමුදාධිපති විසින් ශාසනාභිවෘද්ධිය උදෙසා අටමස්ථානාධිපති අතිපූජ්‍ය පල්ලේගම හේමරතන නාහිමියන් වෙත මූල්‍ය පරිත්‍යාගයක්ද සිදුකරන ලදී. ආගමික වතාවත්වලින් අනතුරුව, ජය ශ්‍රී මහා බෝ සමිඳු පරිශ්‍රයට බටහිර දොරටුවෙන් ඇතුළු වන ස්ථානයේ සියලුම පුද්ගලයින්ගේ ශරීර පරීක්ෂා කිරීම සඳහා නවතමයෙන් ඉදිකරන ලද විශේෂ ආරක්ෂක කුටිය යුද්ධ හමුදාපති විසින් විවෘත කරන ලදී. ඒ සඳහා මහජන බැංකුව අනුග්‍රාහකත්වය දක්වා ඇත.

# යුද්ධ හමුදාධිපති අනුරාධපුර "අභිමංසල - I" හි සංචාරයක





අනුරාධපුර ශ්‍රී මහා බෝ සමිඳුන් අභියසදී 74 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව පැවති ආශිර්වාද පූජාවෙන් අනතුරුව යුද්ධ හමුදාධිපති ඇතුළු පිරිස රණක්ෂිතයට පත්ව නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා අනුරාධපුර "අභිමංසල - I" හි සංචාරයකද නිරත වූහ.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඇතුළු එහි ජ්‍යෙෂ්ඨ සාමාජිකාවෝ රැසක්ද එක්වූ මෙම සංචාරයේදී රණවිරුවන්ගේ සුවදුක් විමසමින් සැම අයෙකු වෙතම අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය අඩංගු තෑග පාර්සල් පිරිනැමීමටද කටයුතු කරන ලදී. යුද්ධ හමුදාධිපති එහිදී එම සුවතා නිකේතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් සමග දිවා භෝජන සංග්‍රහයකට ද එක්විය. සංචාරය සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක, ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්, ආරක්ෂක සේනා ආඥාපතිවරුන්, පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ, අභිමංසල - 1 සුවතා නිකේතනයේ සේනාවිධායක ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් ද එක් වූහ.



# පොපි මල් දිනය සංකේතවත් කරමින්





දේශය වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන් අනුස්මරණය කරමින් පොපිමල් දිනයට සමගාමීව ශ්‍රී ලංකා සේවාමුක්ත හට සංගමයේ සාමාජිකයෝ ඉකුත් සැප්තැම්බර් 19 වන දින සන්ධාගාරයේ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූහ.

යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුවූ මෙම හමුවේදී එම සංගමයේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑම්යූආර් පෙරේරා යූඑස්පී (විශ්‍රාමික) විසින් යුද්ධ හමුදාධිපති වෙත පොපි මලක් පළඳවනු ලැබීය. එහිදී යුද්ධ හමුදාධිපති ශ්‍රී ලංකා සේවා මුක්ත හට සංගමය වෙතින් දැනට ක්‍රියාත්මක කරනු ලබන සුබසාධන ව්‍යාපෘති පිළිබඳව ද විමසා බැලුවේය. මෙම හමුව සමාප්තියේ, යුද්ධ හමුදාධිපති විසින් ශ්‍රී ලංකා සේවා මුක්ත හට සංගමය වෙත සමරු තිළිණ ප්‍රදානයක්ද සිදුකරමින් ඔවුන් විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ඇගයීමටද ලක්කළේය.

මෙම අවස්ථාව සඳහා පොපි කමිටුවේ සභාපති බ්‍රිගේඩියර් ඒඑච් ලියනගේ (විශ්‍රාමික), පොපි කමිටුවේ ලේකම් ලුතිනන් කර්නල් ඒකේ සියඹලාපිටිය පීඑස්සී එල්එස්සී (විශ්‍රාමික), එම කමිටුවේ මේජර් පීකේසීඑස් කංකානම්ගේ යූඑස්පී (විශ්‍රාමික) ඇතුළු තවත් සාමාජිකයන් කිහිපදෙනකු සහභාගී වූහ. පළමුවන ලෝක සංග්‍රාමය අවසන් වීමෙන් අනතුරුව සියලුම පොදුරාජ්‍ය මණ්ඩලීය සාමාජික රටවල් සේවයේ යෙදී සිටියදී දිවිපිදූ හමුදා සාමාජිකයන්ගේ කැපවීම ඇගයීමට ලක්කරමින් සෑම වසරකම නොවැම්බර් මාසයේ දෙවන ඉරිදා දිනට යෙදෙන පොපි දිනය සමරනු ලබයි.



# උසස්වීම් ලැබූ මේජර් ජෙනරාල්වරුන් වෙත යුද්ධ හමුදාධිපතිගේ සුරතින් නිල ලාංඡන

මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ යුද්ධ හමුදාවේ බ්‍රිගේඩියර් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 08 දෙනකු වෙත නිල ලාංඡන පැළඳවීම ඉකුත් සැප්තැම්බර් මස 13 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් සිදුකෙරිණ.

දේශයේ ආරක්ෂාව වෙනුවෙන් ආදර්ශමත් සේවයක නිරතවීමට වඩාත් කැපවීමෙන් කටයුතු කරන බවට සහතික වෙමින් එලෙස යුද්ධ හමුදාධිපතිගේ සුරතින් නිල ලාංඡන පළඳවන ලද්දේ ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු මැද) ආඥාපති මේජර් ජෙනරාල් ඒකේ රාජපක්ෂ ආර්එස්පී, යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් ජීඒ මුණසිංහ ආර්එස්පී ඒටීම්, 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී පීඑස්සී, යුද්ධ හමුදා යුද විද්‍යාලයේ පුහුණු සේනාවිධායක මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් පීආර් පතිරවිතාන යූඑස්ඩබ්ලිව්සී පීඑස්සී, ආරක්ෂක අමාත්‍යාංශයේ හමුදා සම්බන්ධීකරණ නිලධාරී මේජර් ජෙනරාල් ඩීපී වෙලගෙදර ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී, 14 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී සහ ඉඩම් දේපළ හා හටනිවාස අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් එම්පීකේ මදුරප්පෙරුම ආර්එස්පී යූඑස්පී පීඑස්සී යන නිලධාරීහු වෙති.



තවද, සැප්තැම්බර් 25 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ටීඅයි මහලේකම් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී හා ජාතික ආරක්ෂක විද්‍යාලයේ පාඨමාලා හදාරමින් සිටින මේජර් ජෙනරාල් කේජීඑන් රසික කුමාර පීඑස්සී වෙතද නිල ලාංඡන පළඳවන ලදී.

# නික්මෙන්නට පෙර

# අගනා මෙහෙයට වටිනා බුහුමන්





නුවරඑළියේදී විශ්‍රාම දිවියට එළඹෙන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කීර්තිමත් හෙල්ල විසිකිරීමේ ක්‍රීඩිකාවක් වන බලලත් නිලධාරිනි I බීඑල් නදීකා ලක්මාලි යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූවාය. මෙම හමුවේදී වසර 23 ක යුද්ධ හමුදා සේවා කාලය තුළ මලල ක්‍රීඩා ඉසව් තුළින් ඇය ලබා ඇති සුවිශේෂී ජයග්‍රහණ පිළිබඳව ඇගයීමට ලක්කළ යුද්ධ හමුදාධිපති ඇයගේ අනාගතය වෙනුවෙන් සිය සුබපැතුම් එක්කළේය. මෙම හමුව සමාප්තියේ යුද්ධ හමුදාධිපති විසින් ඇය වෙත විශේෂ සමරු තිළිණයක් ද ප්‍රදානය කරන ලද අතර, මෙම අවස්ථාවට යුද්ධ හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පීඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ද සහභාගී විය.



වර්ෂ 2000 ජූලි මස 25 දින යුද්ධ හමුදාවට එක් වූ බලලත් නිලධාරිනි I බීඑල් නදීකා ලක්මාලි ගේ යුද්ධ හමුදා සේවා කාලය තුළ 2008 චීනයේ බීජිං ඔලිම්පික් ක්‍රීඩා උළෙලේදී 22 වන ස්ථානය, 2013 වර්ෂයේ රුසියාවේ මොස්කව් *'IAAF'* ලෝක ශූරතා ක්‍රීඩා උළෙලේදී 12 වන ස්ථානය, 2014 සහ 2010 වර්ෂයන්හිදී පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේදී 6 වන සහ 7 වන ස්ථාන, 2014, 2006 සහ 2010 වර්ෂයන්හිදී පැවති ආසියානු ක්‍රීඩා උළෙලේදී 5 වන, 7 වන සහ 8 වන ස්ථාන, 2019, 2015 සහ 2007 වර්ෂයන්හිදී පැවති *'CISM* - ලෝක හමුදා" ක්‍රීඩා උළෙලේදී 3 වන සහ 4 වන ස්ථාන, 2011, 2013, 2003, 2005 සහ 2002 වර්ෂයන්හිදී පැවති ආසියානු ශූරතා ක්‍රීඩා උළෙලේදී 2 වන, 4 වන, 5 වන, 7 වන සහ 9 වන ස්ථාන හිමිකර ගත්තේය. 2005 වසරේ සිට 2019 වසර දක්වා අඛණ්ඩව ඇය ජාතික ශූරිය බවට පත්වූ අතර, 2003, 2006, 2007, 2008, 2010, 2013, 2014, 2015, 2018 සහ 2023 වර්ෂයන්හිදී පැවති ජාතික ක්‍රීඩා උළෙලේ ශූරිය සහ හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් 2007 වසරේ සිට 2012 වසර දක්වා ආරක්ෂක සේවා ශූරතාවලියේ ශූරිය බවට ද පත්වූවාය.




# යුද්ධ හමුදා නිලධාරීන් නීතිමය කරුණු සබැඳිව දැනුවත් කෙරේ

රාජකාරියේදී දැනුවත්ව සිටිය යුතු නීතිමය කරුණු සබැඳිව යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයන් දැනුම්වත් කිරීමේ වැදගත්කම යුද්ධ හමුදාධිපතිතුමන් නිරන්තර අවධාරණය කරන කරුණකි. එය තවදුරටත් අරුත් ගන්වමින් එතුමන්ගේ උපදෙස් හා මගපෙන්වීම මත පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය සහ නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය එක්ව ඉකුත් සැප්තැම්බර් 20 වන දින පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ පිහිටි යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසල් ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී වැඩසටහනක් පැවැත්විණ.



ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති කවුෂල්‍ය නවරත්න, ජ්‍යෙෂ්ඨ නීතිඥ ප්‍රියානි රත්නායක, නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ජනක බණ්ඩාර, ජනාධිපති නීතිඥ ශවේන්ද්‍ර ප්‍රනාන්දු, ජ්‍යෙෂ්ඨ නීතිඥ අමල් රන්දෙණිය සහ ජ්‍යෙෂ්ඨ නීතිඥ ගාමිණී ද අල්විස් යන මහත්ම මහත්මීන් එම එහිදී දේශන පැවැත්වූහ. "දික්කසාද නීතිය", "සයිබර් අවකාශයේ සිදුකරන වැරදි", "සාපරාධී අපකීර්තිය සහ පවතින නීතිවලට අදාළ සංශෝධන", "ත්‍රස්තවාදී පනත සහ හදිසි නීති රෙගුලාසි", "අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ විරෝධතාවන් විසුරුවා හැරීමට අදාළ නීති", "ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට අදාළ නීති" සහ "මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ අන්තරායකර ඖෂධ ආඥාපනත සම්බන්ධ නීති" යන මාතෘකා ඔස්සේ එහිදී දේශන පැවැත්විණ.













මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ද සහභාගී වීම විශේෂත්වයකි. මෙම දැනුවත් කිරීම් දේශනය සඳහා යුද්ධ හමුදා මූලස්ථානය සහ බටහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ සේවයේ නියුතු නිලධාරීන් 150 ක් සහ සෙසුනිලයන් 850 කට අධික පිරිසක් සහභාගී වූහ.





# යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේ සංචාරයක

ලෙබනනයේ සංචාරයක නිරත යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඊඑස්එස් වනසිංහ ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ප්‍රමුඛ ශ්‍රී ලංකා දූත පිරිස ඉකුත් සැප්තැම්බර් මස 06 වන දින ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේදී එහි බලසේනාධිපති බ්‍රිගේඩියර් ජෙනරාල් චොක් බහදූර් ධකල් (*Brigadier General Chok Bahadur Dhakal*) හමුවිය.

මෙම සංචාරයේදී, ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකායේ නියෝජ්‍ය බලසේනාධිපති විසින් ශ්‍රී ලංකා මූලස්ථාන ආරක්ෂක භට කණ්ඩායමේ සේවය ඇගයීමට ලක්කළ අතර පුහුණුව, නිපුණත්වය සහ ඕනෑම අභියෝගයකට මුහුණදීමේ හැකියාව තුළින් සාමය ආරක්ෂා කිරීම සඳහා ඔවුන් දක්වන කැපවීම පිළිබඳව ද අවධාරණය කළේය.



රට ආර්ථික දුෂ්කරතාවයකට ලක්ව ඇති අවස්ථාවක ශ්‍රී ලංකා යුද්ධ හමුදා භටපිරිස් කෙරෙහි විශ්වාසය තබමින් කටයුතු කිරීම සබැඳිව යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී විසින් එක්සත් ජාතීන්ගේ අතුරු බලකාය වෙත සිය ස්තුතිය පුදකළ අතර නුදුරේදී එරට සේවය වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා භටපිරිස්හි ප්‍රමාණය ඉහළ නැංවීමේ හැකියාව පිළිබඳව ද පැහැදිලි කළේය.

මෙම සංචාරය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී, විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ කර්නල් විදේශ මෙහෙයුම් කර්නල් පීපීසී පෙරේරා පීඑස්සී සහ ලෙබනනයේ 14 වන ශ්‍රී ලංකා මූලස්ථාන ආරක්ෂක භට කණ්ඩායමේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ඩීපීඑල්ටී කළුඅග්ගල ද සහභාගී වූහ.

# මෙරට යුද්ධ හමුදා දූත පිරිස ලෙබනනයේ ශ්‍රී ලංකා තානාපති හමුවෙති



ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේ 14 වන ශ්‍රී ලංකා මූලස්ථාන ආරක්ෂක භට කණ්ඩායම වෙත පදක්කම් ප්‍රදානය කිරීමේ උත්සව අවස්ථාව සඳහා සහභාගී වූ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ප්‍රමුඛ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දූත පිරිස ඉකුත් සැප්තැම්බර් මස 05 වන දින ලෙබනනයේ, බෙයිරූට්හි පිහිටි තානාපති නිල නිවසේදී එහි තානාපති ශ්‍රී ලංකා තානාපති කපිල සුසන්ත ජයවීර මහතා හමුවූහ.

# “ආමරිය සීල්” සහ “යුදබිමේ කුරුටු ගී” එළිදකී




යුද්ධ හමුදා මනෝ විද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂක මණ්ඩලයේ රණවිරුවා සඟරාවේ ප්‍රධාන සංස්කාරක ලෙස කටයුතු කරන ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් රචිත "ආමරිය සීල්" සහ "යුදබිමේ කුරුටු ගී" යන ග්‍රන්ථ කොළඹ 07, මහවැලි කේන්ද්‍රයේදී ඉකුත් අගෝස්තු මස 07 වන දින එළිදක්විණි. යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සිඩ් රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ එම අවස්ථාවට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක කොමසාරිස් ජෙනරාල් පාලිත නානායක්කාර, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් බණ්ඩාර මාපා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ප්‍රනීත් අංබේසුන්දර, ප්‍රවීන චිත්‍රපටි නලු අමින්ත වීරසිංහ ඇතුළු විද්වතුන් රැසක්ද ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් සහ සෙසු ආරාධිතයින් රැසක් ද සහභාගී වූහ. ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ මේ වනවිට යුද අත්දැකීම් ඇසුරින් ග්‍රන්ථ 07 ක් එළිදක්වා ඇත.

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් මෙම ග්‍රන්ථ එළිදැක්වීම සඳහා අවශ්‍ය කඩිනම් අනුමැතිය ලබාදෙමින් නිරන්තරව එම නිර්මාණකරුවන් දිරිගැන්වීම වෙසෙසින්ම අගය කළ යුත්තකි. අප රට තුළ යුද සාහිත්‍යය බිහිකිරීම වස් නව නවත් නවක නිර්මාණකරුවන් බිහිවනු දැකීම යුද්ධ හමුදාධිපතිගේ අපේක්ෂාවයි.



යුද්ධය පැවති සමයේ රණවිරුවන් විසින් ලියන ලද බංකර් කුරුටු ගී අලලා මෙම "අවිකාරයින්ගේ කවිකාර ලියවිලි" ග්‍රන්ථය ලියවී ඇත. එදවස රණබිමෙහි විරුවන් අත්විඳි දුක, වේදනාව, හුදකලාව, සතුට, ඉච්ඡාභංගත්වය ආදී මානුෂීය හැඟීම් පිළිබඳ පොදු සමාජයට මෙම ග්‍රන්ථය හරහා පැහැදිලි අදහසක් ලබාගත හැකිය. සීගිරිය කුරුටු ගී ගැන ඉතිහාසයේ පටන් කතාබහ කර ඇති අතර, සිපිරිගෙය තුළද නේවාසිකාගාර තුළද වෙනත් එවැනි බොහෝ ස්ථානවලද මිනැතරම් කුරුටු ගී ලියවී ඇත. නමුත් ඒ සියල්ල අතරේ අවි ගැටුනු යුද බිම තුළද එවැනි කුරුටු ගී විශේෂයෙන් ලියවී තිබුණු බව මෙම ''යුද බිමේ කුරුටු ගී'' කෘතිය හරහා කතුවරයා ගෙනහැර පායි.



අවියකින් වෙඩි උණ්ඩයක් පත්තු නොවී බෝම්බයක් පිපිරෙන්නේ නැතුවද යුද්ධ තිබුණි. අවි ගැටුමක් නොපැවතියද මරණය අත වනන භූමියක පාරිසරික දුෂ්කරතාවන්ද, මානසික පීඩනයද දරාගෙන කෙනෙක් එහි රැඳී සිටීමද යුද්ධයකි. ''ආමරිය සීල්'' පොත හරහා කතුවරයා කෙටිකතා 22ක් ඔස්සේ කියා ඇත්තේ එවන් යුදමය පරිසරයක නිහඬ, සත්‍ය කතා පිළිබඳවය.





# "කොකාවිල් රණවිරු" ස්මාරකය

## ඉදිකිරීමට මුල්ගල තැබේ





කපිතාන් සාලිය උපුල් අලදෙණිය පීඩබ්ලිව්වී

"පරම වීර විභූෂණ" පදක්කමෙන් පිදුම් ලැබූ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රණවිරුවකු වන කපිතාන් සාලිය උපුල් අලදෙණිය පීඩබ්ලිව්වී අනුස්මරණය කිරීම සඳහා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථාන පරිශ්‍රයේ ඉදිකෙරෙන ස්මාරකයක් සඳහා පසුගියදා මුල්ගල තැබිණ.

වර්ෂ 1990 ජූලි මස 11 වන දින කොකාවිල් කඳවුරේ සිටි තම සගයන්ගේ ජීවිත ආරක්ෂා කිරීමේ අරමුණින් තම ජීවිතය ගැන නොසිතා ත්‍රස්තවාදීන්ට මුහුණ දී තම මව් බිම වෙනුවෙන් ජීවිතය පුදකරන ලද කපිතාන් සාලිය උපුල් අලදෙණිය පීඩබ්ලිව්වී ගේ නිර්භීත ක්‍රියාව සිහිපත් කිරීම සඳහා වූ මෙම ස්මාරකය ඉදිකිරීමේ කටයුතු පසුගිය සැප්තැම්බර් 14 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථාන පරිශ්‍රයේදී ආරම්භ කෙරිණ.

රට වෙනුවෙන් ජීවිත පූජාවෙන් සිදුකළ සුවිශේෂී වීර ක්‍රියාවන් වෙනුවෙන් රණවිරුවන් සඳහා පිරිනමන ඉහළම හමුදා සම්මානයද වන මෙම "පරම වීර විභූෂණ" පදක්කම හිමිකර ගත් ප්‍රථම නිලධාරියා බවට කපිතාන් සාලිය අලදෙණිය ඉතිහාස ගතව ඇත. එම නිලධාරී රට වෙනුවෙන් සිදුකරනු ලැබූ කැපකිරීම සහ ජීවිත පරිත්‍යාගය අගයමින් ශ්‍රී ලංකා හමුදා ඉතිහාසයේ ප්‍රථම වතාවට ඔහුගේ මියයාමෙන් පසුව දෙවන ලුතිනන් නිලයේ සිට කපිතාන් නිලය දක්වා නිල දෙකකින් එකවර උසස් කිරීමද විශේෂත්වයකි.

මෙම ඓතිහාසික අවස්ථාවට ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ටීකේආර් සිල්වා කේඑස්පී ඇතුළු එම මූලස්ථානයේ නිලධාරීන් හා සෙබළුන් රැසක් සහභාගී වූහ.





# "තෘප්තිමත් හා නිර්භීත හමුදාවක්"
# මැයෙන් එක්දින වැඩමුළුවක්

**යුද්ධ හමුදාධිපති ගේ මගපෙන්වීම මත මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේඩබ්ලිව්ඩීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ "තෘප්තිමත් හා නිර්භීත හමුදාවක්" තේමාව කොටගනිමින් නිලධාරීන් සහ සෙසුනිලයින් වෙනුවෙන් සංවිධානය කෙරුණු එක්දින වැඩමුළුව 1 බලකාය, නෙළුම් පියස ශ්‍රවණාගාරයේදී ඉකුත් සැප්තැම්බර් 15 වන දින පැවැත්විණ.**







වර්තමානයේ රට තුළ පවතින ආර්ථික, සමාජයීය හා දේශපාලනික වටපිටාව තුළ යුද්ධ හමුදා සමාජිකයින් විවිධ අභියෝගයන්ට මුහුණදෙමින් සිටී. ඒ අතරතුර බාහිර පාර්ශවයන් විසින්ද ඔවුන්ගේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් යොදා ගනිමින් විවිධ නීති විරෝධී ක්‍රියාවන්ට ගොදුරු කරගනිමින් සිටී. එබැවින් යුද්ධ හමුදා සමාජිකයින් සේවය හැර යෑම, මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධවීම, අවිආයුධ වෙළදාමට නැඹුරුවීම, මූල්‍ය වංචාවන් සඳහා හසුවීම, ක්ෂණික මූල්‍ය ප්‍රතිපාදන ක්‍රම සඳහා යොමුවීම, ලිංගික අපයෝජන ක්‍රියාවන්වලට පෙළඹීම ඇතුළු නීති විරෝධී ක්‍රියාවන් වලක්වාලමින් ඔවුන්ව දැනුවත් කොට ඵලදායී සේවාවක් ලබාගැනීම මෙම වැඩසටහනෙහි අරමුණයි.

එහිදී, "අභිමානවත් සොල්දාදුවා" යන මාතෘකාව යටතේ මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ මේජර් සචිත් බණ්ඩාර (මනෝවිද්‍යා උපදේශක) ද "මනෝවිද්‍යාත්මක පුද්ගල අධ්‍යයනය තුළින් නිර්භීත හමුදාවක් බිහිකිරීම" යන මාතෘකාව ඔස්සේ ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක (මනෝවිද්‍යා උපදේශක) ද දේශන සිදුකළහ.

මෙම එක්දින වැඩමුළුව සඳහා 1 බලකායේ සේවයේ නියුතු නිලධාරීන් 21 දෙනකු හා සෙසුනිලයින් 573 දෙනකු සහභාගී වූ අතර, ඊට සමගාමීව මාර්ගගත තාක්‍ෂණය (ZOOM) ඔස්සේ සමස්ත යුද්ධ හමුදාවේ ස්ථාන 300 ක් ආවරණය කරමින් නිලධාරීන් 363 දෙනකු සහ සෙසුනිලයින් 7529 දෙනකු එක්වූහ.



# සුහද හමුවක මතක සටහන්





යාපනය අර්ධද්වීපයේ සංචාරයක නිරත වූ ශ්‍රී ලංකා එක්සත් ජනපද තානාපති කාර්යාලයේ ජ්‍යේෂ්ඨ ආරක්ෂක නිලධාරී/ආරක්ෂක උපදේශක කර්නල් ඇන්තනී නෙල්සන් සහ සහකාර ආරක්ෂක උපදේශක සෙත් නෙවින්ස් යන නිලධාරීන් ඉකුත් අගෝස්තු 23 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) සංචාරයක නිරතවෙමින් එහි ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ හමුවී සාකච්ඡාවක නිරතවූහ.

තවද, ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානී ඔලිවර් ප්‍රාස් මහතා සහ ප්‍රථම ලේකම් (දේශපාලන) ජස්ටින් බොයිලියට් මහත්මිය ද ඉකුත් අගෝස්තු 23 වන දින ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති හමුවී සාකච්ඡාවක නිරතවිය.

මෙම සාකච්ඡාවලදී යාපනය අර්ධද්වීපයේ යුද්ධ හමුදාව සහ සිවිල් ජනතාව අතර සහයෝගීතාවය, සමාජ සුභසාධක ව්‍යාපෘති, ආරක්ෂක තත්වය සහ සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරන ලදී.

## කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් වෙත ඉඩමක් නැවත භාරදෙයි





රජයේ ප්‍රතිපත්තිවලට අනුව යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත ආරක්ෂක සේනා ආඥාපති (යාපනය) මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් කිලිනොච්චිය, ආනන්දපුරම් ප්‍රදේශයේ මෙහෙයුම් අවශ්‍යතා මත යුද්ධ හමුදාව විසින් භාවිතා කරනු ලැබූ අක්කර 1 රූඩ් 3 ක් සහ පර්චස් 10.52 ක ඉඩමක් පවරා දීමේ නිල ලේඛනය ඉකුත් සැප්තැම්බර් මස 14 වන දින කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් රූපවතී කේතීස්වරන් මහත්මිය වෙත නිල වශයෙන් භාරදෙන ලදී.





# විශේෂ අතිරේක ප්‍රහාරක බණ්ඩ පුහුණු පාඨමාලා අංක 06

ආරක්‍ෂක සේනා ආඥාපති (වන්නි) මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඒඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී ව්එස්ව් යූඑස්පී එන්ඩීයූ ගේ උපදෙස් මත පොම්පේමඩු බළඇණි පුහුණු පාසලේදී පැවති "විශේෂ අතිරේක ප්‍රහාරක බණ්ඩ පුහුණු පාඨමාලා අංක - 06" ඉකුත් සැප්තැම්බර් 20 වන දින එම පුහුණු පාසල් පරිශ්‍රයේදී සාර්ථකව අවසන් විය. ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) යටතේ ස්ථාපිත 21, 54, 56, පාබල සේනාංක නියෝජනය කරමින් නිලධාරීහු 05 දෙනකු සහ සෙසුනිලයෝ 175 දෙනකු ඇතුළත් බණ්ඩ 10 ක් මෙම පාඨමාලාව සඳහා සහභාගී වූහ.

පාඨමාලාවේ විෂය නිර්දේශය සඳහා ජී.පී.එස්. අභ්‍යාස, නිරායුද සටන් ක්‍රම (*UC*), ප්‍රභූ ආරක්ෂාව (*VIP/VVIP*), ජීව වෙඩි තැබීමේ අභ්‍යාස, සෙවීමේ සහ ගලවාගැනීමේ මෙහෙයුම්, සම්බන්ධවීමේ නීති (*ROE*), විශේෂ ක්‍රියාන්විත ක්‍රියාමාර්ග සහ අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි (*IS*) පිළිබඳ දේශන සහ ප්‍රායෝගික සැසි ඇතුළත් විය. පාඨමාලාවේ සමාප්ති දේශනය ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති විසින් පවත්වනු ලැබූ අතර, එම අවස්ථාවට 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහභාගී විය.

පාඨමාලාවේ හොඳම බණ්ඩය වශයෙන් 3 සන්නාහ සන්නද්ධ බලකාය සම්මාන හිමිකරගත් අතර, විජයබාහු පාබල රෙජිමේන්තුවේ ලුතිනන් කේබීඊඑච්ආර් කැප්පෙටියාගොඩ දැක්වූ සුවිශේෂී නායකත්ව කුසලතාවය වෙනුවෙන් හොඳම බණ්ඩභාර නිලධාරී ලෙස සම්මාන ලැබීය. 17 (ස්වෙච්ඡා) ශ්‍රී ලංකා පාබල හමුදාවේ කෝප්‍රල් පියරත්න එස්පීඑන්ජේ හොඳම පෙළ අණදෙන්නා වශයෙන් සම්මාන දිනාගත් අතර, 12 (ස්වෙච්ඡා) විජයබාහු පාබල රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් හේරත් එච්එම්එස්ඒ සෑම අතින්ම අතිශූර සෙබලා බවට පත්විය. 17 (ස්වෙච්ඡා) ශ්‍රී ලංකා පාබල හමුදාවේ කෝප්‍රල් සුබසිංහ දක්‍ෂතම වෙඩික්කරුවා වශයෙන් සම්මාන දිනාගත් අතර, 2 යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ මාණ්ඩලික සැරයන් බණ්ඩාර ජීඩබ්ලිව්එස්ඒ හොඳම ශාරීරික යෝග්‍යතාවයෙන් හෙබි සෙබලා ලෙස සම්මාන දිනාගත්හ.

# කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලයේ නියෝජිත පිරිසක් ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) සංචාරයක



කොළඹ, කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලයේ නියෝජිත පිරිසක් ඉකුත් සැප්තැම්බර් මස 18 වන දින නැගෙනහිර පළාතේ හදිසි අවස්ථා ව්‍යාප්ති සූදානම පිළිබඳ සාකච්ඡා කිරීමේ අරමුණින් ආරක්ෂක සේනා (නැගෙනහිර) සුහද සංචාරයක නිරත වූහ.

එහිදී, ආඥාපති මේජර් ජෙනරාල් එම්කේයූපී ගුණරත්න ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී හමුවූ කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක වැඩසටහන් නිලධාරී හර්ෂ සේනානායක මහතා සහ කැනේඩියානු හමුදා පොලිස් ආරක්ෂක සේවයේ රොන් බෙබුස්චේර් (*Ron Bebusschere*) මහතා රජයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග ශක්තිමත් ජාලයක් ස්ථාපිත කිරීමටත් සහයෝගීතාවය වැඩි දියුණු කිරීමත් ප්‍රදේශයේ හදිසි අවස්ථා සඳහා සූදානම, ආපදා ප්‍රතිචාර සහ ආරක්ෂාව සම්බන්ධ කරුණු පිළිබඳව ද සාකච්ඡා කළහ.



# ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති 22 වන පාබල සේනාංකයේ සංචාරයක



නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති පසුගිය අගෝස්තු මස 31 හා සැප්තැම්බර් මස 01 යන දිනවල ත්‍රිකුණාමලයේ 22 වන පාබල සේනාංකයේ සහ ඒ යටතේ ඇති පාබල බලසේනාවල සිය පළමු නිල සංචාරය සිදු කරන ලදී.

ඒ අනුව, ප්‍රථමයෙන් ඔහු 22 වන පාබල සේනාංක මූලස්ථානය වෙත සපැමිණි අතර, එහිදී එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ එහි වගකීම් හා කාර්යභාරය පිළිබඳව දැනුවත් කළේය.

පසුව 221 වන පාබල බලසේනාව හා 2 (සේවා) ගජබා රෙජිමේන්තුව ද ඔහුගේ නිරීක්ෂණයට බඳුන් විය. එම සංචාරයේ දෙවන දිනයේදී ත්‍රිකුණාමලය දිසාපති චමින්ද හෙට්ටිආරච්චි සහ ප්‍රධාන ලේකම් ආර්එම්පීඑස් රත්නායක යන මහත්වරු හමුවී අදහස් හුවමාරු කරගැනීමටද ආඥාපති කටයුතු කළේය. එමෙන්ම, ඉන්දියානු තෙල් සංස්ථාවෙහි උප සභාපති, කෝනේශ්වරම් හින්දු කෝවිලේ ප්‍රධාන පූජක සහ අල් හුහුල් මුස්ලිම් පල්ලියේ ප්‍රධාන මවුලවි ඇතුළු රාජ්‍ය නිලධාරීන් හා ආගමික නායකයන්ද හෙතෙම හමුවීමට අමතක නොකළේය එමෙන්ම 223 සහ 222 වන පාබල බලසේනාවන් ද ඔහුගේ පරීක්ෂාවට ලක්විය.



# පොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්

533 වන පාබල බලසේනාවේ හටපිරිස් ඉකුත් අගෝස්තු 15 වන දින අනුරාධපුර, ගන්තිරියගම, මහින්ද මහා විද්‍යාලයේ පාසල් දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා එම විද්‍යාලයීය පුස්තකාලය වෙත පොත් ප්‍රදානය කිරීමේ කටයුත්තකට එක්වූහ.

53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී සහ 533 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඒඑම්එස්ඩීබී අධිකාරි ආර්එස්පී ගේ ඉල්ලීමකට අනුව ඕස්ට්‍රේලියාවේ 'Sydney Central Coast' හි වෙසෙන ලාංකික ප්‍රජාව, පාලිත අදිකාරම් මහතා හා එම මහත්මිය ඇතුළු තවත් පරිත්‍යාගශීලීන් කිහිප දෙනකු මෙම සමාජ සත්කාරය සඳහා අනුග්‍රාහකත්වය ලබාදුන්හ. මෙම උත්සව අවස්ථාවට 533 පාබල බලසේනාවේ බලසේනාධිපති, ඒකක අණදෙන නිලධාරීන් ඇතුළු පිරිසක් එක්වූහ.



# දිළිඳු පවුලක් වෙත නිසට සෙවනක්



2 වන කමාන්ඩෝ රෙජිමේන්තුවේ සුභසාධක ව්‍යාපෘතියක් ලෙස එම ඒකකයේ හටපිරිස් කිලිනොච්චිය, තිරුමුරුක්කණ්ඩි ප්‍රදේශයේ වෙසෙන ආර්ථික අපහසුතා මධ්‍යයේ දිවිගෙවන පවුලක් වෙනුවෙන් ඉදිකරනු ලැබූ නව නිවසක් ඉකුත් අගෝස්තු 31 වන දින 53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් නිවාසලාභීන් වෙත පවරාදෙනු ලැබීය.

එම නිවස හිමිවූ කේ දිජ්වරන් මහතා දියණියක් සහ පුතණුවකු සමග පොල්අතු සෙවිලි කළ නිවසක ජීවත්වූ අතර, ඔහුට දණහිස් දෙකෙහි පසුගිය දිනක සිදුකරනු ලැබූ සැත්කමක් හේතුවෙන් ඇවිදීමට පවා අපහසු ඇත.







# යුද්ධ හමුදා කෙඩෙට් නිලධාරීන් මුලතිව් බලප්‍රදේශයේ සංචාරයක



ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය දියතලාව වෙතින් පුහුණුව ලබන පාඨමාලා අංක 92 හා 92 බී හි කෙඩෙට් නිලධාරීහු 66 දෙනකු සහ උපදේශක නිලධාරීන් 04 දෙනකු ඉකුත් සැප්තැම්බර් 20 වන දින ආරක්‍ෂක සේනා (මුලතිව්) බලප්‍රදේශයේ අධ්‍යයන සංචාරයක නිරත වූහ.

එම කෙඩෙට් නිලධාරීන් හට එහිදී එම බලප්‍රදේශය පිළිබඳ හැඳින්වීමක් ආරක්‍ෂක සේනා මූලස්ථානයේ කර්නල් ප්‍රමානි කර්නල් එම්ඩීඑස්එන් කරුණාරත්න පීඑස්සී විසින් සිදුකළ අතර, එමගින් මුලතිව් ප්‍රදේශයේ යුද සමය පැවති අයුරු සහ සිවිල් ජනතාවගේ ජන ජීවිතය නගාසිටුවීම සඳහා යුද්ධ හමුදාව ක්‍රියාකරන ආකාරය සබැඳිව දැනුවත් කරන ලදී. ඉන් අනතුරුව ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ විසින් එම කෙඩෙට් නිලධාරීන් සමග සුහද පිළිසඳරක නිරතවූ අතර මෙම සංචාරයක සිහිවීම වස් කෙඩෙට් නිලධාරීන් විසින් ආඥාපති වෙත සමරු ඵලකයක් ද පිළිගන්වන ලදී.

මෙහිදී, 68 වන පාබල සේනාංක බලප්‍රදේශයේ ඇති සබ්මැරීන් අංගනය හා විජයග්‍රාහී සැමරුම් ස්මාරකය යන ස්ථාන නැරඹීමටද කෙඩෙට් නිලධාරීන් අමතක නොකළේය. මෙම අවස්ථාවට එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ද එක්විය.

# ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති සිය බලප්‍රදේශයේ සංචාරයක



ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ඉකුත් සැප්තැම්බර් 07 සහ 08 යන දෙදින තුළ 61 වන පාබල සේනාංකයේ සහ ඒ යටතේ ස්ථාපිත බලසේනා සහ ඒකකයන්හි ක්ෂේත්‍ර සංචාරයක නිරතවිය.

61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඒජේඑන් රණසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ සිය සංචාරය ඇරඹූ ආඥාපති එම සේනාංක මූලස්ථානය, 612, 613 හා 611 වන පාබල බලසේනාවන්හිද 8 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ ද සංචාරය කළේය. එහිදී, එම බලප්‍රදේශයන්හි වත්මන් තත්වය පිළිබඳ සොයාබැලූ හෙතෙම එහි භටපිරිස් ආමන්ත්‍රණය කරමින් ඔවුන්ගේ කාර්යභාරය ඇගයීමටද ලක්කළේය.



# කොටහේන ශ්‍රී පරමානන්ද විහාරස්ථානයේ ඇසල පෙරහැර අති උත්කර්ෂවත් අන්දමින්

කොටහේන, ශ්‍රී පරමානන්ද පුරාණ විහාරස්ථානයේ වාර්ෂික ඇසල මහා පෙරහැර ඉකුත් සැප්තැම්බර් මස 15 වන දින පැවැත්වූ අතර, එම විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් යුද්ධ හමුදාධිපතිගෙන් කරනු ලැබූ ඉල්ලීමකට අනුව පෙරහැර පැවැත්වීමට ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) විසින් දායකත්වය ලබාදෙන ලදී. ආරක්ෂක සේනා ආඥාපති (බටහිර) මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී යුද්ධ හමුදාධිපති නියෝජනය කරමින් මෙම උත්සව අවස්ථාවට සහභාගී වූ අතර, මෙම විචිත්‍රවත් වාර්ෂික ඇසල මහා පෙරහැර නැරඹීම සඳහා යුද්ධ හමුදා නිලධාරීන්, සෙසු නිලයින් සහ නරඹන්නන් විශාල පිරිසක් සහභාගී වූහ.





# පොදු සේවා බලකා පුහුණු පාසලේ සංචාරයක මතක සටහන්





ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති  සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියංගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී එම බලකායේ බලකාධිපති ධුරයේ රාජකාරී භාරගැනීමෙන් අනතුරුව ඉකුත් සැප්තැම්බර් මස 08 වන දින කුට්ටිගල ප්‍රදේශයේ ස්ථාපිත ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකා පුහුණු පාසල වෙත සිය ප්‍රථම නිල සංචාරය සිදුකළේය.

සංචාරයේ නිරත බලකාධිපති එම පුහුණු පාසලේ විවිධ භූමිකාවන්, වගකීම්, පුහුණු වැඩසටහන්, එම පුහුණු පාසල තුළ ක්‍රියාත්මක පාඨමාලා සහ පරිපාලන කටයුතු පිළිබඳ සොයාබැලීය. අනතුරුව එතුමන් හටපිරිස් සමඟ සුහද අදහස් හුවමාරුවක ද නිරතවිය. සිය සංචාරය තුළදී 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය සහ 2 (ස්වෙච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායට අයත් ගොවිපළවල් දෙකක් නිරීක්ෂණය කිරීමටද ආඥාපති එක්විය.

# දියතලාව යුද්ධ හමුදා මූලික රෝහල වෙත වෛද්‍ය උපකරණ පරිත්‍යාගයක්

ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති ගේ මඟපෙන්වීම මත එම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ සේවයේ නියුතු හටපිරිස් විසින් ඉකුත් සැප්තැම්බර් මස 12 වන දින දියතලාව ප්‍රදේශයේ ස්ථාපිත යුද්ධ හමුදා මූලික රෝහල වෙත වෛද්‍ය උපකරණ තොගයක් පරිත්‍යාග කරනු ලැබීය.



විදේශ පරිත්‍යාගශීලීන්ගේ අනුග්‍රාහකත්වය මත සිදුකළ මෙම වැඩසටහන යටතේ රෝහල් බලධාරීන් වෙත ඇස් කණ්නාඩි, වෛද්‍ය නලා, *Infrared and Tympanic Thermometer*, කතුරු, ප්ලාස්ටික් තැටි ඇතුළු වෛද්‍ය උපකරණ තොගයක් පරිත්‍යාග කෙරිණි.

ශ්‍රී ලංකා රෝහල් ගිලන්රථ සේවා සංගමයේ අධ්‍යක්ෂ රජවැල්ලේ සුභූති හිමිපාණන් සහ ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) හටපිරිස් හි සම්බන්ධීකරණය මත එක්සත් රාජධානියේ "සිල්වියා පදනම", ඕස්ට්‍රේලියාවේ සිඩ්නි සහ මෙල්බර්න් රෝහල් සේවා මණ්ඩල සාමාජිකයින්ගේ අනුග්‍රාහකත්වය මත මෙම වෛද්‍ය උපකරණ පරිත්‍යාගය සිදුකෙරිණි.



මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එස්සීකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී, දියතලාව යුද්ධ හමුදා මූලික රෝහලේ අණදෙන නිලධාරී මේජර් කේආර්ජී පෙරේරා යූඑස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයෝ පිරිසක් එක්ව සිටියහ.

# අභිමානවත් 29 වන සංවත්සරය සමරමින්



ඉකුත් සැප්තැම්බර් 14 වන දිනට යෙදුණු ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) මූලස්ථානයේ 29 වන සංවත්සරයට සමගාමීව එහි ආඥාපති මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්ටීසී මෙත්තානන්ද යූඑස්පී එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් රැසක් පැවැත්විණ.

එහිදී, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන හිගුරක්ගොඩ ධර්මපාල බෝසත් බාලිකා ළමා නිවාස භූමිය සුද්ධ පවිත්‍ර කර එහි නේවාසික ළමුන් 46 දෙනකු සඳහා දිවා ආහාර වේලක් හා පාසල් උපකරණ ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම ඒ අතර ප්‍රධාන විය. තවද එදිනම භටපිරිස්හි සහභාගීත්වයෙන් මින්නේරිය දේවාලයට පිවිසෙන වැව් බැම්ම දෙපස හා දේවාල පරිශ්‍රය පිරිසිදු කිරීම හා සවස දේව පූජාව ද පැවැත්විණ. එසේම, ඉකුත් සැප්තැම්බර් 14 වන දින ආඥාපති වෙත කඳවුරු මුරයක් පිරිනැමීමද ආඥාපති විසින් සියලු භටපිරිස් ඇමතීමද එදින සන්ධ්‍යාවේ සෝමාවතිය පුදබිමෙහි පැවති බෝධිපූජා පිංකම ද විශේෂ විය.

# බන්ධනාගාර නියාමක සංස්කරණ පාඨමාලාව සාර්ථකව අවසන්



බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙහි ඉල්ලීම පරිදි බන්ධනාගාර නිලධාරීන් හට පෞද්ගලික විනය හා සාමූහික නායකත්ව දැනුම වර්ධනය කර තම දෙපාර්තමේන්තුව තුළ කාර්යක්ෂමව රාජකාරි කිරීම සඳහා අවශ්‍ය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් අම්පාර සටන් පුහුණු පාසල මගින් පැවැත්වූ " බන්ධනාගාර නියාමක සංස්කරණ පාඨමාලාව" ඉකුත් අගෝස්තු 28 දිනෙන් ඇරඹී සැප්තැම්බර් 14 වන දින සාර්ථකව අවසන් විය.

මෙම පාඨමාලාවෙහි සමාප්ති අවස්ථාවට එම සටන් පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහ අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්, බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක ආචාර්ය චන්දන ඒකනායක, බන්ධනාගාර ප්‍රධාන ජේලර් කාවින්ද ප්‍රේමවංස යන මහත්වරුද පුහුණු පාසලේ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨකොනොනි, කොනොනි රැසක් ද සහභාගී වූහ. මෙම පාඨමාලාවේ "අති විශිෂ්ට සාමාර්ථයක්" ලබාගනිමින් ප්‍රථම ස්ථානය දිනාගැනීමට බන්ධනාගාර නියාමක පීඩී පෙරේරා සමත්විය.





# 24 වන පාබල සේනාංකයට නව සෙවනක්

24 වන පාබල සේනාංකයේ අභිනවයෙන් ඉදිකරන ලද බලලත් නිලධාරීවරුන්ගේ හා සැරයන්වරුන්ගේ නිවස්නය විවෘත කිරීම ඉකුත් සැප්තැම්බර් 08 වන දින එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව් චන්ද්‍රසිරි ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.

එම සේනාංකයට මෙතෙක් පැවති අඩුපාඩුවක් සම්පූර්ණ කරමින් මෙම බලලත් නිලධාරී සහ සැරයන් නිවස්නයෙහි සිහිනය සැබෑ වූයේ මීට පෙර රාජකාරී කරන ලද සේනාංකාධිපතිවරුන්ගේ සහ වත්මන් සේනාංකාධිපති ගේ සාමූහික උත්සාහයක ප්‍රතිඵලයෙනි. මෙම නිවස්නය බලලත් නිලධාරීවරුන්ගේ සහ සියළුම ජ්‍යෙෂ්ඨකොනොනිවරුන්ගේ එකමුතුකම සංකේතවත් කරන අතර, ඔවුන්ගේ මානසික නිදහස සහ සම්ප්‍රදායන් පවත්වාගෙන යාමටද එය සෘජුව ඉවහල් වේ. මෙහි ඉදිකිරීම සඳහා කැපවූ සාමාජික සාමාජිකාවන්ගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම සඳහා මෙම නිවස්නය පහසුකම් සහිත භෝජනාගාර ශාලාවකින්ද සමන්විත වන අතර, එහි සාමාජිකයින් හට එකට එක්වී ප්‍රිය සම්භාෂණ පැවැත්වීමේ හැකියාවද පවතී.

# රණවිරුවකු හට හිසට සෙවනක්





ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති ගේ අදහසකට අනුව ක්‍රියාත්මක කරනු ලැබූ පූර්ණ නිවාස ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ 17(සේවා) ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සෙ/22ඩී00050 කෝප්‍රල් පොඩිරත්න කේ යන කොනොනිගේ අංගොඩවිල, අලවත්තේගම, රිකිල්ලගස්කඩ යන ලිපිනයේ ඉදිකරන ලද නව නිවස ඉකුත් සැප්තැම්බර් 04 වන දිනට යෙදුණු සුබ මොහොතින් සෙබළ අයිතියට පවරාදෙන ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මෙන්ම ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ සහභාගී විය. මෙහිදී, අදාළ නිවස ඉදිකිරීමේ කටයුතු සඳහා දායකත්වය ලබාදුන් හටපිරිස් වෙත සහතිකපත්‍ර ප්‍රදානය කිරීමද රෙජිමේන්තු අධිපති ගේ සුරතින් සිදුවිය.

# රණකාමී විරුවන්ට අත්කම් හුරුවක්







අත්තිඩිය මිහිඳුසෙත් මැදුර සුවසහන නිකේතනයේ රණකාමී රණවිරුවන්ගේ නිර්මාණාත්මක හැකියාවන් ඔප්නැංවීම හා ඔවුන්ගේ එම හැකියාවන්වලට වටිනාකමක් එක් කිරීමේ අරමුණින් Royal Fernwood Porcelain Limited ආයතනය විසින් පෝසිලේන් භාණ්ඩවල චිත්‍ර නිර්මාණය කිරීම පිළිබඳ වැඩමුළුවක් පසුගිය සැප්තැම්බර් 14 වන දින එම සුවසහන නිකේතනයේදී පවත්වන ලදී. එම අවස්ථාවට මිහිඳුසෙත් මැදුර සුවසහන නිකේතනයේ සේනාවිධායක ඇතුළු එහි කාර්යය මණ්ඩලයද එක්වූහ.

# වැඩිහිටියන් සඳහා දිවා භෝජන සංග්‍රහයක්



51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ මඟපෙන්වීම යටතේ 513 වන පාබල බලසේනාවේ 28 වන සංවත්සර දිනයට සමගාමීව සිත්තන්කේනි සිවභූමි වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් සඳහා ඉකුත් අගෝස්තු 23 වන දින දිවාභෝජන සංග්‍රහයක් පිරිනැමිණ.

පිරිමි පුද්ගලයින් 20 දෙනකු සහ කාන්තාවන් 36 දෙනකු සඳහා දිවාභෝජනය පිළිගැන්වුනු අතර, ඔවුන් වෙනුවෙන් සංගීත වැඩසටහනක්ද පැවැත්විණ. 513 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්ආර් රාසික් ආර්එස්පී විසින් එම වැඩිහිටි නිවාසයේ ප්‍රයෝජනය සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ තොගයක් ද පරිත්‍යාග කරන ලදී.

# මානව හිමිකම් හා අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ උසස් පාඨමාලාව අංක - 26





මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්‍ෂ මණ්ඩලයේ පූර්ණ අධීක්‍ෂණය යටතේ මානව හිමිකම් හා අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ උසස් පාඨමාලා අංක - 26 (නිලධාරී) ඉකුත් අගෝස්තු 14 වන දින සිට සැප්තැම්බර් 12 වන දින දක්වා සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනය - කුකුලේගඟ හිදී පවත්වන ලදී.

මේ සඳහා යුද්ධ හමුදා නිලධාරීන් 17 දෙනකු, නාවික හමුදා නිලධාරීන් තිදෙනකු හා ගුවන් හමුදා නිලධාරීන් දෙදෙනකු සහභාගී වූහ. පාඨමාලාවේ ප්‍රථම ස්ථානය නාවික හමුදාවේ *NRX*1885 කමාන්ඩර් කේපී බුද්ධික වෙතද, යුද්ධ හමුදා සේවා බලකායේ නි/70928 කපිතාන් ඩබ්ලිව්ජීඩී තත්සර දෙවන ස්ථානයද නාවික හමුදාවේ *NRX*2740 ලුතිනන් කමාන්ඩර් එච්එච්ආර් ප්‍රභාත් තෙවන ස්ථානයද හිමිකරගත්හ. පාඨමාලාවේ සහතිකපත් ප්‍රදානය කිරීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී සහභාගී විය.



# අභිමානවත් සංවත්සරය සමරමින්





52 වන පාබල සේනාංකය ස්ථාපිත කර ඉකුත් අගෝස්තු 24 වන දිනට වසර 28 ක් සපිරීම නිමිත්තෙන් එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සංවත්සර වැඩසටහනක් පැවැත්විණ. 23 වන ගැමුණු හේවා බලකායේ හටපිරිස් විසින් සේනාංකාධිපති වෙත එහිදී සම්මාන මුරයක් පිරිනමමින් බුහුමන් පිදූ අතර රුක් රෝපණය, හටපිරිස් ආමන්ත්‍රණය සහ සියලුනිල දිවාභෝජන සංග්‍රහය සේනාංකාධිපති ගේ ප්‍රධානත්වයෙන් එහි පැවති සෙසු වැඩසටහන් අතර ප්‍රමුඛ විය.

# මාහැඟි පරිත්‍යාග රැසක්




ෆොන්ටේරා සමාගමේ මූල්‍ය දායකත්වය මත 51 වන පාබල සේනාංකයේ 28 වන සංවත්සරයට සමගාමීව එම සේනාංකයේ හටපිරිස් විසින් වැඩසටහන් මාලාවක් ඉකුත් සැප්තැම්බර් 12 වන දින පවත්වන ලදී.

51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්බී වෙලගෙදර ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවති එම වැඩසටහනේදී පලාලි උතුර ජීටීඑම්, පොන්නාලේ වර්ධරාජා පෙරුමාල්, සංගරතෙයි සින්නම්මා, කාර්තිකේය යන පාසල් වෙත රුපියල් ලක්ෂය බැගින් මූල්‍යාධාර පිරිනැමීම සහ සිසුන් 200 දෙනකු සඳහා කෙටි ආහාර වේලක් ලබාදීමද සිදුකෙරිණ. තවද, සෙල්වපුරම් සහ යෝගපුරම් ප්‍රදේශවල තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් 100 ක් සඳහා වියළි සලාක මලු බෙදාදීම සහ ක්‍රීඩා භාණ්ඩ පරිත්‍යාග කිරීමක්ද සිදුකෙරිණ.

# ජන දිවියට අතහිත





51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ මගපෙන්වීම යටතේ විශ්‍රාමික මේජර් ජෙනරාල් රවී රත්නසිංහම් ගේ අනුග්‍රාහක දායකත්වයෙන් යාපනය උඩුවිල් ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා රුපියල් 5000.00 ක වටිනාකමකින් යුත් වියළි සලාක මලු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 06 වැනි දින සිදුකෙරිණ.

# සංචාරයක මතක සටහන්





11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්එම්එම් රණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉකුත් සැප්තැම්බර් 19 වන දින 111 වන පාබල බලසේනාවේ සහ 2(සේව) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සංචාරයක නිරතවිය. එහිදී, 111 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එස්එන් ඇයිගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එම පාබල බලසේනාවේ ඉටුකරන ලද රාජකාරි පිළිබඳ සේනාංකාධිපති දැනුවත් කළේය. සිය සංචාරයේදී ප්‍රදේශයේ රාජකාරි නියුතු භටපිරිස් ඇමතීමටද සේනාංකාධිපති අමතක නොකළේය.

## ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරස්ථානයට නව නාමපුවරුවක්

ඉකුත් මාර්තු මස 09 වන දින වනවිට නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති ලෙස රාජකාරි කළ මේජර් ජෙනරාල් ජී හෙට්ටිආරච්චි ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී විසින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 4 ඇල ප්‍රදේශයේ පිහිටි ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරයේ සදහම් මන්දිරයක් සහ උමං ලෙන් කෞතුකාගාරයක් ඉදිකිරීම සඳහා මුල්ගල තබන ලදී.

එම විහාරස්ථානයේ පිහිටි එම සදහම් මන්දිරයේ නාමපුවරුව ඉකුත් අගෝස්තු 25 වන දින 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී පිඑස්සී අතින් නිරාවරණය කෙරිණි.



## අඩු ආදායම්ලාභී පවුලක් වෙත නව නිවසක් පරිත්‍යාග කෙරේ



613 වන පාබල බලසේනා බලප්‍රදේශයේ පිහිටි 2 (සේව) ගැමුණු හේවා බලකායේ භටපිරිස්හි ශ්‍රම දායකත්වය, තාක්ෂණික හා ඉංජිනේරු දැනුම යොදාගනිමින් ගාල්ල, වක්වැල්ල ප්‍රදේශයේ විවිධ දුෂ්කරතා මධ්‍යයේ දිවිගෙවන පවුලක් වෙනුවෙන් "එවරස්ට්" ක්‍රීඩා සමාජයේ අනුග්‍රාහකත්වය මත නව නිවසක් ඉදිකරදෙනු ලැබිය.

එම නිවස විවෘත කිරීමේ උත්සවයට සපැමිණි 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ජේඑන් රණසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ සුරතින් නිවාසලාභී ගාල්ල, වක්වැල්ල ප්‍රදේශයේ පදිංචි කේඑස්කේ පෙරේරා මහත්මිය සහ ඇගේ පවුලේ සාමාජිකයින් වෙත නිවසේ යතුර භාරදෙන ලදී.



# වියළි සලාක බෙදාදීමේ සත්කාරයක්



ආරක්ෂක සේනා (බටහිර) බලප්‍රදේශයේ රාජකාරී නියුතු ආර්ථික අපහසුතාවයෙන් පෙළෙන විවාහක යුද්ධ හමුදා සාමාජිකයින් 100 දෙනකු සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් වියළි සලාක මලු බෙදාදීමේ වැඩසටහනක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනී ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගිය සැප්තැම්බර් 04 වන දින යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසල - පනාගොඩ දී පවත්වන ලදී.



මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ඇතුළු යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සාමාජිකාවෝ රැසක් ද 14 සහ 61 සේනාංක මූලස්ථානයන්හි සේනාංකාධිපතිවරු ද සහභාගී වූහ.







# යුද්ධ හමුදා තූර්ය වාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලයේ සෙබළ සෙබළියන්ගේ සුවදුක් විමසමින්

යුද්ධ හමුදා තූර්ය වාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලයේ සෙබළ සෙබළියන්ගේ සුවදුක් විමසීම සඳහා යුද හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය පසුගිය සැප්තැම්බර් 01 වන දින රත්මලානේ පිහිටි එම අධ්‍යක්ෂ මණ්ඩලයේ සංචාරක නිරත වූවාය.

එහිදී, යුද්ධ හමුදා තූර්ය වාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පීආර්බීඒ බණ්ඩාර ආර්එස්පී සමග සේවා වනිතා ඒකකයේ සභාපතිනිය එම අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරී කරනු ලබන යුද්ධ හමුදා සාමාජිකයින්ගේ හට නිවාසයන්හි සංචාරයක නිරතවෙමින් ඔවුන්ගේ සුවදුක් සොයා බැලුහ. එහිදී, ඔවුන් සමග තේ පැන් සංග්‍රහයකටද එක්වූ ඇය එම අධ්‍යක්ෂ මණ්ඩලයේ නවතමයෙන් ඉදිකරන ලද රූපලාවන්‍යාගාරය විවෘත කිරීමටද එක්වූවාය.









# “විරු සිසු ප්‍රදීප” ශිෂ්‍යත්ව ප්‍රදානය




ක්‍රියාන්විත හා රාජකාරියට අදාළ හේතුන් මත මියගිය හා ආබාධිත රණවිරුවන්ගේ දූ පුතුන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීමේ අරමුණින් 2021 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් දූ පුතුන් 51 දෙනකු සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටහනක් සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගිය සැප්තැම්බර් 11 වන දින පැවැත්විණ. එහි පළමු වැනි සහ දෙවැනි අදියර යටතේ ශිෂ්‍යත්වය සමත් දූ පුතුන් 191 ක් දෙනකු සඳහා මීට පෙර ශිෂ්‍යත්ව ප්‍රදානය කොට ඇති අතර, එහිදී රුපියල් 25,000.00 බැගින් යුත් ලංකා බැංකුවේ ළමා ඉතුරුම් ගිණුම් විවෘතකර එම දරු දැරියන්ට ලබාදී තිබිණ.



සංඥා බලකායට අයත් බනි II ආරියදාස ජේඑම්ජේආර් රණවිරුවාගේ ඥාති සොහොයුරියගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රවණාධාර කට්ටලයක් පිරිනැමීමද, ගජබා රෙජිමේන්තුවේ රාජකාරී කරනු ලබන කෝප්‍රල් අමරසිංහ කේඩීපී රණවිරුවාගේ අඩක් වැඩ නිමකර ඇති නිවසේ ඉතිරි වැඩ කොටස නිමකරගැනීම සඳහා රුපියල් ලක්ෂ තුනහමාරක මුදලක් පරිත්‍යාග කිරීමද එහිදී සේවා වනිතා සභාපතිතුමියගේ සුරතින් සිදුකෙරිණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් සිදුකරනු ලබන සුභසාධන කටයුතු වඩාත් ශක්තිමත්ව කරගෙන යාම සඳහා දිරිගැන්වීමක් ලෙස එම ඒකකය වෙත සිංහ රෙජිමේන්තු සේවා වනිතා සභාපතිනි ඔමිලා ජයවර්ධන මහත්මිය අතින් එහිදී මූල්‍ය පරිත්‍යාගයක් සිදුකරනු ලැබුවාය.



# සිංහ විරුවන්ට සේවා වනිතාවෙන් පරිත්‍යාග







සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඔමිලා ජයවර්ධන මහත්මිය ආරාධනයෙන් එම රෙජිමේන්තුවේ පැවති ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ උත්සවයක් සඳහා යුද හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඉකුත් සැප්තැම්බර් 02 වන දින එක්වූවාය. එම වැඩසටහනේදී එම රෙජිමේන්තුවලට අයත් රණවිරුවන්ගේ පාසල් අධ්‍යාපනය හදාරනු ලබන දූ දරුවන් 100 දෙනකු සඳහා පාසල් උපකරණ කට්ටල ලබාදීම, ආබාධිත තත්වයට පත් රණවිරුවන් 10 දෙනකු සඳහා අත්වාරු ලබාදීම, ආබාධිත රණවිරුවකු සඳහා රෝදපුටුවක් ලබාදීම, ක්‍රියාන්විත හේතූන් මත මියගිය රණවිරුවන්ගේ බිරින්දෑවරුන් හට ස්වයං රැකියා සිදුකරගෙන යාම සඳහා ඇස් කණ්ණාඩි ලබාදීම ආදී පරිත්‍යාග රැසක් සිදුකරන ලදී. ඒ සඳහා වැයවූ මුදල රුපියල් ලක්ෂ විසිපහකට අධිකය.

මෙම අවස්ථාවට සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, යුද හමුදා නිලධාරීන්, එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්, සෙසුනිලයින් ඇතුලු ඔවුන්ගේ දූ දරුවන් හා දෙමව්පියන් රැසක් සහභාගී වූහ.

# කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවෙන් ශිෂ්‍යාධාර





ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තුවේ රාජකාරී නියුතු හමුදා සාමාජිකයින්ගේ විශේෂ අවශ්‍යතා ඇති දරුවන් වෙනුවෙන් ශිෂ්‍යාධාර සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අගෝස්තු 17 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි චාමා වනසිංහ මහත්මියගේ අදහසකට අනුව සිදුකරන ලද මෙම වැඩසටහන සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි මෙන්ම රෙජිමේන්තු කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ඇතුළු එම සේවා වනිතා සාමාජිකාවන් රැසක්ද එක්වූහ.

# සිංහ රෙජිමේන්තු මහා සභා රැස්වීම





සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ මහා සභා රැස්වීම පසුගිය සැප්තැම්බර් 23 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී එහි සේවා වනිතා ශාඛා සභාපතිනි ඔමිලා ජයවර්ධන මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. ඊට එම සේවා වනිතා ශාඛාවේ ක්‍රියාකාරී සාමාජිකාවන්, සෙසුනිල භාර්යාවන් ඇතුළුව 150 දෙනකු පමණ සහභාගී වූහ. එම සංවත්සර වැඩසටහනට යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරී නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් පැවැත්වූ "රණවිරු බිරිඳකගේ කාර්යභාරය" මැයෙන් වූ හරවත් දේශනයක්ද ඇතුළත් විය.

තවද, එහිදී එම රෙජිමේන්තුවට අයත් රණවිරුවකුගේ දරුවකුට ප්‍රතිකාර සඳහා වෛද්‍යාධාර ලෙස රුපියල් 100,000.00 ක්ද තවත් රණවිරුවකු හට රුපියල් 50,000.00 ක වෛද්‍යාධාර මුදලක්ද සිවිල් සේවක මහතකුගේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය හදාරනු ලබන දරුවකු හට ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් ප්‍රදානය කිරීමද සිදුකෙරිණ.

# විජයබාහු පාබල රෙජිමේන්තුවෙන් අධ්‍යාපනයට අත්වැලක්





විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහසභා රැස්වීම එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි හිමාලි පුස්සැල්ල මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් සැප්තැම්බර් 09 වන දින එම රෙජිමේන්තු "ද සැලියුට්" උත්සව ශාලාවේදී පැවැත්විණ. එහිදී මූල්‍ය අපහසුතා ඇති රණවිරු පවුල් 21 කට අයත් දූ දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ පරිත්‍යාග කිරීමක් සහ ක්‍රියාන්විතයේදී පුද්ගලනාශක බිම් බෝම්බයකට හසුවී දෙපා දනහිසට ඉහළින් ඉවත් කර සිටින සෙ/509396 කෝප්‍රල් රංජිත් එස්පීඑස් යන අය විසින් කරගෙනු යනු ලබන ස්වයං රැකියාව සඳහා යන්ත්‍රසූත්‍ර මිලදීගැනීම වෙනුවෙන් රුපියල් 30,000.00 ක මූල්‍ය පරිත්‍යාගයක්ද සිදුකරන ලදී.

# යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවෙන් මාහැඟි ක්‍රියාවක්



යාන්ත්‍රික පාබල රජිමේන්තුවේ සේවයේ නියුතු සෙ/829273 කෝප්‍රල් ඉලංගරත්න ආර්එම්ඩබ්ලිව්එස්බී හට ඔහුගේ අලුත උපන් නිවුන් දරුවන් වෙනුවෙන් මාසිකව රුපියල් 10,000 ක මුදලක් ලබාදීමට එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ප්‍රියංගා වික්‍රමසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් සැප්තැම්බර් 02 වන දින සිදුකෙරිණ. මෙම මාහැඟි සත්කාරය සඳහා ඕස්ට්‍රේලියාවේ පදිංචි ජගත් රාජපක්ෂ හා කෝසලා රණවීර යන අය මූල්‍ය පරිත්‍යාගය දරණු ලැබූහ.

# අකුරු කරන්නට දිරිදෙමින්



කමාන්ඩෝ රෙජිමේන්තුවේ සේවය කරනු ලබන සිවිල් සේවක මහතුන්ගේ පාසල් අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනී නිමාලි රණතුංග මහත්මියගේ ප්‍රධානත්වයෙන් රෙජිමේන්තු දේශන ශාලාවේදී ඉකුත් සැප්තැම්බර් 09 වන දින පැවැත්විණ. මෙම වැඩසටහනේදී සිවිල් සේවක මහතුන් 99 දෙනකුගේ පාසල් අධ්‍යාපනය ලබන දූ දරුවන් 160 දෙනකු සඳහා පාසල් උපකරණ බෙදාදීමද සිදුවිය.

එමෙන්ම 3 වන කමාන්ඩෝ රෙජිමේන්තුවට අනුයුක්තව රාජකාරි කරනු ලබන සෙ/558780 ලා/කෝ නිශ්ශංක එම්ජ්ජී යන රණවිරුවා ඇතුළු දෙමාපියන් පදිංචි නිවස පසුගියදා පැවති අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් ගිනි ගැනීමකට ලක්ව සම්පූර්ණයෙන් විනාශවීම නිසා නව නිවසක් ඉදිකර ගැනීම සඳහා මුදල් පරිත්‍යාග කිරීමද එම වැඩසටහනට සමගාමීව සිදුකෙරිණ.

# අභිමංසල 1 සුවසහන නිකේතනයේ සංචාරයක





සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනී රාජිනා ජයසූරිය මහත්මිය ඇතුළු ජ්‍යෙෂ්ඨ සාමාජිකාවෝ අනුරාධපුරය අභිමංසල 1 සුවසහන නිකේතනයෙහි ප්‍රතිකාර ලබන නේවාසික රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා පසුගිය අගෝස්තු 19 වන දින එම නිකේතනයෙහි සංචාරයක නිරත වූහ. එහිදී, ඔවුන් විසින් එම ආයතනය වෙත අත්‍යවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍යය බෙදාදීමටද කටයුතු කරන ලදී.

# "යහපත් පවුල් ජීවිතයක් ගතකිරීම" මැයෙන් දේශනයක්





14(සේවා) ඉංජිනේරු සේවා බලකායේ ඒකක සංවත්සර දිනයට සමගාමීව එම බලකා සේවා වනිතා ශාඛාව වෙතින් සංවිධානය කළ "යහපත් පවුල් ජීවිතයක් ගතකිරීම" මැයෙන් වූ හරවත් දේශනයක් පසුගිය අගෝස්තු 11 වන දින පැවැත්විණ. ඒ සඳහා 14(සේවා) ඉංජිනේරු සේවා බලකායේ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන්, නිලධාරිනියන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# 5 වන සේවා බලකා සේවා වනිතා ශාඛාව වෙතින් ලේ දන්දීමේ වැඩසටහනක්.

සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපති තුෂාරි වනිගසේකර මහත්මියගේ ප්‍රධානත්වයෙන් 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩීඑම් ජයසිංහ සහ එම ඒකකය සේවාවනිතා ශාඛාවේ සභාපතිනි අයෝමා ජයසිංහ මහත්මියගේ මෙහෙයවීමෙන් ලේ දන්දීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. 200 අධික පිරිසකගේ සහභාගීත්වයෙන් යාපනය ශික්ෂණ රෝහලේ ලේ බැංකුව සඳහා අවශ්‍ය රුධිර පාරවිලන පරිත්‍යාග කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ඉකුත් අගෝ. 26 වන දින එම ඒකකය තුළදී පැවැත්විණ.



මේ සඳහා යාපනය ශික්ෂණ රෝහලේ වෛද්‍ය එම් ප්‍රදීපන් මහතා සහ වෛද්‍ය ආර් කන්නන් මහතා මෙන්ම යාපනය ශික්ෂණ රෝහලේ මහජන සෞඛ්‍ය පරීක්ෂණ නිලධාරී රවීනදාස මහතා ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලය සෞඛ්‍ය අංශය වෙත ඉහළම දායකත්වය ලබාදෙන ලදී.

# වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවෙන් හරවත් දේශනයක්





වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ අදහසකට අනුව එම බලකායට අයත් නිලධාරීන් සහ සෙසුනිලයින් වෙනුවෙන් සාර්ථක ජීවිතයක් සඳහා ධනාත්මක චින්තනය, රාජකාරි කටයුතු සඳහා දෛනික කටයුතු සමබර කරගැනීම හා සෞඛ්‍යමත් අන්තර් සබඳතා පවත්වා ගැනීම පිළිබඳ දේශනයක් ඔෂධී ද සිල්වා අල්විස් මහත්මිය විසින් ඉකුත් සැප්තැම්බර් 16 වන දින කොළඹ යුද්ධ හමුදා රෝහල් ශ්‍රවණාගාරයේදී පවත්වනු ලැබුවාය. එම අවස්ථාවට වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි විශේෂඥ වෛද්‍ය නිල්මිණි ප්‍රනාන්දු මහත්මිය, එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් 250 ක් පමණ සහභාගී වූහ. තවද, එදින වෛද්‍ය බලකායට අයත් නි/70501 ලුතිනන්(උපා) එම්එල්එන් ප්‍රේමරත්න යූඑස්පී ගේ ස්නායු ආබාධ තත්වයකින් පෙළෙන දරුවා හට ලැප්ටොප් යන්ත්‍රයක් පරිත්‍යාග කිරීමද සිදුවිය.

# යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවෙන් මාහැඟි පරිත්‍යාගයක්

2023 වර්ෂයෙහි යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ වැඩසටහන් සැලැස්මට අනුව 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය වෙතින් වත්තේගම "සුරසා" බාලිකා ළමා සංවර්ධන මධ්‍යස්ථානය වෙත දිවා ආහාර වේලක් ලබාදීම සහ අත්‍යාවශ්‍ය භාණ්ඩ පරිත්‍යාග කිරීමේ වැඩසටහන් ඉකුත් අගෝස්තු 15 වන දින සිදුකරන ලදී. රෙජිමේන්තු අධිපතිගේ හා එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි බන්දුනි මාග්‍රට් රණසිත් රණවක මහත්මියගේ අධීක්ෂණය යටතේ සිදු වූ මෙම වැඩසටහන සඳහා 4 ශ්‍රීලයුයුබ අණදෙන නිලධාරී ඇතුළු ඒකක සාමාජිකයෝ සහභාගී වූහ.





# පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහසභා රැස්වීම





පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ 22 වැනි වාර්ෂික මහා සභා රැස්වීම ඉකුත් සැප්තැම්බර් මස 16 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා රෙජිමේන්තු මූලස්ථානයේදී එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ප්‍රියන්තිකා ද සොයිසා මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහිදී, එම බලකායේ සේවයේ නියුතු භටපිරිස්හි තෝරාගත් පවුල් වල ශ්‍රවණාබාධවලින් පෙළෙන දරුවන් සඳහා ශ්‍රවණාධාර ප්‍රදානය කරන ලදී. තවද, එහි සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය උපදෙස් මත එම බලකායේ සේවයේ නියුතු භටපිරිස් අතරින් විශේෂ වෛද්‍ය අවශ්‍යතා සහිත දරුවන් සිටින පවුල් සඳහා රුපියල් 75,000.00 බැගින්ද ප්‍රදානය කරන ලදී. වැඩසටහනේ අවසාන අංගය ලෙස "*Life Management*" යන මැයෙන් හරවත් දේශනයක් වෘත්තීය උපදේශක සහ මනෝචිකිත්සක වෛද්‍ය චමින්ද වීරසිරිවර්ධන මහතා විසින් පවත්වන ලද අතර, එහිදී ජීවන කුසලතා සහ ස්වයං කළමනාකරණය පිළිබඳ සහභාගී වූවන් දැනුවත් කිරීමක්ද සිදුකරනු ලැබීය.




# පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වැඩ භාරගනී

රෙම ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස හිමාලි නියංගොඩ මහත්මිය පසුගිය අගෝස්තු 21 වන දින වැඩ භාර ගන්නා ලදී.

# අත්කම් නිර්මාණය සහ අලෙවිකරණය පිළිබඳ වැඩමුළුවක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ පූර්ණ අධීක්ෂණය මත දිරිය ලියන් බලගැන්වීමේ පරමාර්ථයෙන් යුතුව අත්කම් නිර්මාණ අලෙවිකරණය සහ අපනයනය පිළිබඳ වැඩමුළුවක් කෘෂි හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශාන්ති අබේසේකර මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් සැප්තැම්බර් 09 වන දින කාලතුවක්කු හමුදා නිලධාරී නිවස්නයේදී පැවැත්විණ. රෙජිමේන්තු සේවා වනිතා සභාපතිවරියන්, සාමාජිකාවන් සහ අපනයන සංවර්ධන දෙපාර්තමේන්තුව, කර්මාන්ත කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කාර්මික තාක්‍ෂණික ආයතනය, නැෂනල් ඩිෂයින් සෙන්ටර් සහ ෆොකස් ව්‍යාපාරික පාසල යන ආයතනයන්හි නියෝජිතයින් මේ සඳහා සහභාගී වූහ.

## යුද්ධ හමුදාවේ ඇල්මබැල්මෙන්

# විකුම්පුර

## වෙසෙන මිනිසුන් සොයා ගියෙමි




**1984 වර්ෂය මන්නාරම් දිස්ත්‍රික්කයට මරණයේ බිය නිරතුරුව දැණුනු වසරකි. ඒ කාලයේ මන්නාරම් පිටි වැල්ලට රාස්සිගේ අච්ච වැටෙද්දී කුණ්ඩුමනිලා, වේලායුදන්ලා පමණක් නොව මොහාමඩ්ලා, ෆාතිමාලාත්, ධර්මදාසලා, නන්දාවතිලාත් තම මරණ වරෙන්තුව සියතින්ම ලියාගෙන අඳුරට ශාපකරමින් ආරක්ෂාව පැතූ සමයක් විය. ඒ වනවිට උත්සන්න වූ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් නිසාවෙන් මේ සියලු දෙනාම සිසිකඩ විසිරෙන්න වුහ. එසේ වූයේ ත්‍රස්තවාදීන් විසින් මෙම ජනතාව ඝාතනය කිරීම, මරණ තර්ජන එල්ල කිරීම හා පැහැරගෙන යාම ආදී වූ අඩන්තේට්ටම් නිසාය. ඒ නිසාම මන්නාරමේ බහුවාර්ගික සහයෝගිතාවට එල්ල වූයේ දැවැන්ත මරු පහරකි.**

මේ ත්‍රස්ත ක්‍රියාකාරකම් නිසාම මන්නාරමේ ජනතාව තම ඉඩම්කඩම් සියල්ල අතහැර දමා වෙනත් ප්‍රදේශයන්ට පදිංචිය සඳහා ගොස් ඇත. යුද්ධයෙන් පසු ඔවුන් යළි ගම්බිම් කරා පැමිණියත් ඔවුන්ට සහනයක් වෙන්නට කිසිවකුත් සිටියේද නැත. එලෙස අසරණව සිටි පිරිසක් වෙනුවෙන් සහනයක් වී ඔවුන්ගේ හිසට සෙවණක් වන්නට එවකට 542 වන පාබල බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති වශයෙන් කටයුතු කළ වත්මන් යුද්ධ හමුදාපති ලුතිනන් ජෙනරාල් විකුම් ලියනගේ කටයුතු කර තිබුණි. ඒ නරිකාඩු ගම්මානය ඉදිකර යුද්ධයෙන් අවතැන් වූවන්ට පිළිසරණක් වෙමිනි. වත්මන් යුද්ධ හමුදාධිපතිවරයාට කරනු ලබන කෘතගුණ සැලකීමක් වශයෙන් ගම්වාසීන් මෙම ගමට විකුම්පුර ලෙස නම් තබා ඇති අතර මෙය ඉතිහාසයට එක්වන්නේ මේජර් ජෙනරාල් ජනක පෙරේරා සිහිවනු වස් බිහිකළ ජනකපුරට පසු යුද්ධ හමුදා නිලධාරියකුගේ නමින් බිහිවූ දෙවැනි ගම්මානය ලෙසයි.



යුද්ධ හමුදාධිපති තුමන්ගේ විකුම්පුර සංචාරයේ මතක සටහන්

එදා තමන් විඳි කටුක අත්දැකීම් විස්තර කරන්නට මන්නාරම විකුම්පුර ගම්මානයේ වෙසෙන ගුණවති සමරවීර මාතාව අප සමග දොඩමළු වූවාය.



ගුණවතී සමරවීර මහත්මිය

"මම උපන්නෙ හැදුනෙ වැඩුනේ මන්නාරම දිස්ත්‍රික්කයේ අඩම්පන් ග්‍රාමයේ මගේ පියාගේ වෙළඳ ව්‍යාපාරයක් තිබුණා අඩම්පන් වල. ඒවා කරගෙන අපි ජීවත් වුණා. පුංචිකාලෙ ඉඳලම ඉගෙන ගත්තෙ මන්නාරම සිංහල මහා විද්‍යාලයේ. ඔහොම ජීවත්වෙගෙන අපි ඉන්න අතරේ මිලේච්ඡ කුරිරු ත්‍රස්තවාදීන්ගෙන් ප්‍රහාර වලට ලක්වෙලා 1984 අවුරුද්දේදී සිද්ද වුනා ගම්බිම් අතඇරලා යන්න."

මෙසේ අනාථ වූ මන්නාරම ප්‍රදේශයේ සිංහල පවුල් සඳහා අනුරාධපුර රත්නමාලි විශ්‍රාම ශාලාවේ අනාථ කඳවුරක් ස්ථාපනය කර තිබූ අතර එය 1984 වර්ෂයේ සිට 1985 වර්ෂය දක්වා පවත්වාගෙන ගොස් ඇත. ඒ අනුව විශාල සිංහල පවුල් ප්‍රමාණයක් එම අනාථ කඳවුරේ නවාතැන් ගෙන ඇත.

පසුව රත්නමාලි විශ්‍රාම ශාලා අනාථ කඳවුරේ සිටි සියලු සාමාජිකයින් මිහින්තලේ අශෝකපුර ප්‍රදේශයේද, තන්තිරිමලේ සඳමල්එළිය ප්‍රදේශයේද පදිංචිකර ඇත. ඒ අනුව 2009 වර්ෂයේදී යුද වාතාවරණය අවසන්වීමත් සමග මන්නාරම ප්‍රදේශය අතහැර වෙනත් ප්‍රදේශයන් වෙත ගොස් සිටි සිංහල, මුස්ලිම් හා දෙමළ වැසියන් නැවත පෙර පදිංචිව සිටි ඉඩම්වලට වරින් වර පැමිණ ඇත. මෙසේ පැමිණි අයවලුන්ගෙන් කොටසක් තමන්ගේ පාරම්පරික ඉඩම්වල පදිංචිව තිබේ. එහෙත් ප්‍රදේශය හැර යන විට තමන්ගේ ඉඩම් පිළිබඳව කිසිදු ලියකියවිල්ලක් හෝ වෙනත් කිසිදු සාක්ෂියක් රැගෙන ගොස් නොතිබූ තවත් පිරිසකට නැවත පැමිණි පසු තම පාරම්පරික ඉඩම්වල අයිතිය අහිමිවී ඇත්තේ ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා සේය. ඉන් ඔවුන්ට සිදුවූයේ කබලෙන් ලිපට වැටෙන්නටය.

පාරම්පරික ඉඩම් අහිමි වූ සිංහල ජනතාව අතරින් නොච්චියාගම ප්‍රදේශයේ සිට පැමිණි සිංහල පවුල් 17 ක් 2009 වර්ෂය අවසානයේදී මන්නාරම දිස්ත්‍රික්කයේ නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉරටේකුලම් ග්‍රාමසේවා වසමට අයත් නරිකාඩු ප්‍රදේශය වෙත පැමිණ පැල්පත් තනා ගනිමින් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණදෙමින් අනවසරයෙන් ජීවත් වෙද්දී එවකට ප්‍රදේශය භාර ග්‍රාම නිලධාරීවරයා විසින් ඔවුන් එම ස්ථානයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇති අතර, පසුව ඔවුනට සෙවණ වී තිබෙන්නේ මුරුන්කන් රජ මහා විහාරයයි.

"2010 යුද්ධය අවසන් වෙන කොටම අපි නැවත පදිංචියට මේ මුරුන්ගන් ගමට පැමිණියා. මුරුන්ගන් ගමට ඇවිල්ල මාස 06ක් පමණ අපි අපේ ඥාති නිවසක නතර වුණා. නතර වෙලා අපේ සභාපති රණසිංහ කියන මහත්මයාගේ, එයාගේ 16 දෙනකුගෙ කණ්ඩායමක් එක්ක මෙහෙට පැමිණියේ යුද්ධය අවසන් වුණු ගමන් ඒ ඇවිල්ල මුරුගන් පන්සල අසල අපේ ඥාති නිවසක නතර වෙලා මාස 06ක කාලයක් අපි ඉන්න කොට අපට රජයේ ඉහල නිලධාරීන්ගෙන් ලැබුනේ කුඩම්මාගේ සැලකිලි. උතුරේ ජීවත්වුණු අපි ත්‍රස්තවාදීන් නිසා අසරණ වෙලා යුද්ධයත් අවසන් වෙලා යුද්ධයෙන් පස්සෙ නැවත පදිංචියට පැමිණිමත් එක්ක සිදුවුණු අසාධාරණකම් එසේ මෙසේ නෙවෙයි."

එවකට 542 වන පාබල බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති වශයෙන් කටයුතු කළ කර්නල් විකුම් ලියනගේ (වත්මන් යුද හමුදාපති) විසින් මෙම ගැටලුවට මැදිහත් වී අදාළ පාර්ශවයන් සමග සාකච්ඡා කර නැවත පදිංචි කිරීම් යටතේ 2012 වර්ෂයේදී නරිකාඩු ගම්මානයේ සීමෙන්ති සංස්ථාවට අයත් රජයේ ඉඩමකින් අක්කර 10 ක ප්‍රමාණයක් නිදහස්කර ගම්මානයක් ආරම්භ කර එක් පවුලකට පර්චස් 20 බැගින් වූ ඉඩම් කට්ටි 54 ක් වෙන්කරදී ඇත. ඒ අනුව එම ඉඩම් නොච්චියාගම හා අනුරාධපුර යන ප්‍රදේශවල සිට පැමිණි සිංහල පවුල් 50 ක්, දෙමළ පවුල් 03 ක් සහ එක් මුස්ලිම් පවුලක් පදිංචි වූහ.

මෙහි පදිංචිව සිටි පවුල් සඳහා ඉන්දියන් ආධාර යටතේ නිවාස 29 ද, ඕස්ට්‍රේලියන් ආධාර යටතේ නිවාස 20 ක් ද වශයෙන් නිවාස 49 ක් තනාදී ඇත. විකුම්පුර ගම්මානයේ සභාපති වශයෙන් කටයුතු කරන එම්.ඒ. රණසිංහ මහතා ඔහු මුහුණ දුන් අත්දැකීම් අප සමඟ බෙදාගත්තේ මෙසේය. එසේම, විකුම්පුර ගම්මානයේ ජීවත්වන දමිළ පවුල් නියෝජනය කරමින් භවානි අප සමඟ පැවසුවේ මෙවැන්නකි.



විකුම්පුර ගම්මානයේ සභාපති
එම්ඒ රණසිංහ මහතා

"මේ ගම 99% ක්ම අපේ යුද හමුදාපතිතුමන්ගේ ශ්‍රම දායකත්වයෙන් බිහිවූ ගම්මානයක්. එතුමා නැත්නම් මේ ස්ථානයේ මෙහෙම ගමක් නැහැ. මුලින් නරිකාඩු කියලා හඳුන්වපු මේ ගම්මානයට අපි විකුම්පුර කියන නම දැම්මෙත් එතුමා මේ ගම වෙනුවෙන් දක්වපු දායකත්වය නිසයි. වර්තමානය වනවිට අපට තියෙන ප්‍රශ්නය තමයි අපට වගා කිරීමට ඉඩමක් නැහැ. අක්කර 06 ක භූමියක් දෙන්න කියලා අපි ප්‍රාදේශීය ලේකම්තුමා මගින් ඉල්ලීමක් කළා. එතුමා දෙන්නම් කියල කිව්වා අක්කර 10ක් නමුත් එකට වාචිකව මිසක් ලිඛිතව දුන්නේ නැහැ. පසුගිය රජයෙන් රුපියල් තුන් ලක්ෂ විසි පන්දහසක් වෙන් කළා. ඒ භූමියත් සුද්දකර ගන්න කියල. නමුත් වන ජීවී එකෙන් ප්‍රශ්නයක් ආපු නිසා මුදල් ආපහු ගියා අපේ වැඩේ කරගන්න බැරි වුණා. නමුත්, අද මේ ගම තියෙන්නෙ යුද හමුදාව නිසා. හමුදාව අපිට උදව් කරන්නේ නැත්නම් අපි ජීවත් වෙලා ඉවරයි. ඇත්ත කථාව ඕකයි." යැයි රණසිංහ මහතා අප සමඟ කීය.

කේ. ආර්. ඉන්ද්‍රානි ප්‍රේමලතාද විවිධ වූ බාධා මැද විකුම්පුර වාසය කරමින් දිවි ගැටගසා ගන්නා කාන්තාවකි. ඇය අප සමඟ කීවේ මෙවැනි අදහසකි.

"මම පොඩි කඩයක් දාගෙන ජීවත් වෙනවා. ඉතින් මේ ගමේ අපි හැමෝම එක වගේම දුක් විඳිනව. ජීවත් වෙන්න මාර්ගයක් හරියට නෑ ඉතින් කුඹුරු කරන්න අපිට ඉඩම් නෑ. මේ වෙද්දී, අපට නල ලිං 06 ක් විතර ලබාදීලු තියෙනවා. එත් හැමෝටම ඒ නළලිංවලින් බොන්න මදි. වතුර ප්‍රශ්නය නිසා තමයි ජීවත් වෙන්න අමාරු. හමුදාවෙන් අපට නිතරම වගේ ආහාර බෑග් එකක් ගෙනත් දෙනවා. මේ ගමේ දෙමළ පවුල් දෙකතුනක්ම ජීවත් වෙනව. හමුදාවෙන් එයාලටත් කිසිම වෙනසක් කරන්නේ නෑ. අපිට දෙන හැම දෙයක්ම ඒ අයටත් දෙනවා. හමුදාවේ අයට සිංහල දෙමළ කියලා වෙනසක් නෑ. හැමෝටම සලකන්නේ එකම විදිහට. ඉතින් එයාලටත් වෙනසක් නැහැ. හැමෝම සිංහල දෙමළ කියලා වෙනසක් නැහැ. හැමෝටම එක වගේ තමයි සලකන්නේ." යැයි ඉන්ද්‍රාණි ප්‍රේමලතා මහත්මිය කීවාය.



භවානි මහත්මිය

"මම අවුරුදු 10ක ඉඳන් මෙතන ඉන්නවා. මෙතන ලොකුම ප්‍රශ්නේ තමයි අපිට වතුර නෑ. ළමයින්ට ඉස්කෝලෙ යන්න බස්එක මෙතන නෑ. හමුදාවෙන් ඇවිත් නිතර නිතර මොනව හරි බඩු අපිට ගෙනත් බෙදලා දෙනවා. අපිට උවමනාවක් උණත් අපි හමුදාව කථා කරනවා. අපිට වතුර ප්‍රශ්නෙට විසඳුමක් දෙන්න පුළුවන් නම් ලොකු උදව්වක්." යැයි භවානි අප සමඟ පැවසුවාය.

තමන්ගේ ප්‍රාථමික රාජකාරිය ඒ අයුරින්ම නොපිරිහෙලා ඉටු කරන යුද්ධ හමුදාව ජාතිය ගොඩනැගීමේ කාර්යභාරය වෙනුවෙන් ඉටු කරන්නේ සුළුපටු මෙහෙවරක් නොවේ. මේ විකුම්පුර ගම්මානය ඊට එක් නිදසුනක් පමණි. එදා මානුෂීය මෙහෙයුමකින් ත්‍රස්තවාදය නිමාකළද ත්‍රස්තවාදයෙන් පීඩාවිඳි ජනතාව අදටත් අපමණ දුක් විඳිති. එදා උතුරු නැගෙනහිර යුද්ධය නිමා කළා සේම යුද්ධයෙන් පීඩාවිඳි ජනතාවගේ අනාගතය සුරක්ෂිත කිරීමේ වගකීමත් දැන් යුද්ධ හමුදාව විසින් හැකි අයුරින් දරමින් රටට ලබාදෙන්නේ අපමණ ජවයකි.



සටහන-:
ලුතිනන් දිලංක ගුණතිලක
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය





# ජයග්‍රහණය

"මගේ පහළොස්වන උපන්දිනය දවසේ ඔබ සියලු දෙනාම දැකගැනීමට ලැබීම ගැන මම සතුටට පත්වෙනවා. ලොකු කුඩා සැමදෙනාම මගේ උපන්දිනයට තෑගි අරගෙන ඇවිත් ඉන්නවා". මෙහෙම කිව්වේ වනාන්තරයේ රජු වන සිංහයා. සිංහයාගේ උපන්දිනයට කැලේ සියලුම සතුන් එකතුවෙලා හිටියා.

ඊළඟට උපන්දින උත්සවයේ කටයුත්ත ගැන සාකච්ඡා කළා. "මීළඟට තියෙන්නේ වේගවත්ම ධාවකයා තේරීමයි" නරියා ප්‍රකාශ කලා නරියා තමයි මේ ධාවන තරඟයේ ප්‍රධාන සංවිධායක. උපන්දින උත්සවයට පැමිණ සිටි අශ්වයා බොහෝම සතුටින් හිටියා. මොකද අශ්වයා දන්නවා එයා තමයි ජයග්‍රාහකයා කියලා. අලියා හොඬය වනමින් අශ්වයාගෙන් ලකුණු දාගන්න මෙහෙම කිව්වා."අශ්වයා මේ තරඟය උඩින්ම දිනනවා. එයාටනේ වේගයෙන්ම දුවන්න පුළුවන්. "ඉබ්බා අසල වාඩිවී සිටි හාවා මෙහෙම කිව්වා "අලියෝ තමුන්නැහේ කොහොමද එහෙම කියන්නෙ? වේගයෙන් දුවන්න පුළුවන් ගොඩක් සත්තු මේ කැලේ ඉන්නවා. මම ඔයාගේ කථාවට එකඟ වෙන්නේ නැහැ"

ඉන්පසු සිංහ රජතුමා කිව්වා. "හොඳයි දැන් තරඟකරුවන්ට ඉදිරිපත් වෙන්න පුළුවනි." අශ්වයා මහත් ආඩම්බරයෙන් වටපිට බලමින් පළමුවෙන්ම තරඟයට ඉදිරිපත් උනා. ඉන්පසු හාවා සහ තවත් සතුන් කිපදෙනෙක් ඉදිරිපත් වුනා. අවසානයේ මී මැස්සකුද ඉදිරිපත් උනා. "ඔයත් මේ තරඟයට ඉදිරිපත් වෙනවාද?" කියා නරියා ඇහුවා. "ඔව් ඇත්ත වශයෙන්ම මමත් ඉදිරිපත් වෙනව" මී මැස්සා කිව්වා. "මී මැස්සාට තරඟයට ඉදිරිපත් වෙන්න දෙනවාද" කියා අලියා ඇහැව්වා.

"මේ තරඟයට තහංචි කිසිවක් නැහැ. සැමෝම එක සමාන ලෙස සලකන නිසා ඕනෑම කෙනකුට තරඟයට ඉදිරිපත් වෙන්න පුළුවනි" ප්‍රධාන සංවිධායක නරියා කිව්වා. මී මැස්සා තරඟයට ඉදිරිපත් වුන නිසා සියලුම සතුන් ඝෝෂා කරමින් ප්‍රසාදය පලකළා. නමුත්, ඔක්කොම සතුන් පුදුම වුනා මී මැස්සා දුවන්නේ කොහොමද කියලා. මේ ගැන ඔක්කොමලා කසුකුසු ගාන්න පටන් ගත්තා. සංවිධායක නරියා සියල්ලන්ම නිශ්ශබ්ද කළා. "සියල්ලන්ම අහගන්න මේක ඉතා වැදගත් තරඟයක්. මොකද සුවිශේෂී තරඟකරුවකු වන මී මැස්සාත් තරඟ කරන නිසා, ඒවාගේම දක්ෂතම ධාවකයා වන අශ්වයාත් තරඟ කරනවා". ඉන්පසුව තරඟ නීතිරීති පහදාදුන් තරඟ සංවිධායක නරියා නරි බිරිඳට තරඟය අවසාන කරන ස්ථානයට ගොස් තරඟයේ ජයග්‍රාහකයා තෝරාදෙන ලෙස උපදෙස් දුන්නා. හොඳයි ඉක්මනින් එන්න. කාලය නාස්ති නොකර තරඟය ආරම්භ කරමු. තවත් උත්සවයේ වැඩ කටයුතු කිරීමට තියෙනවා. තරඟය ඇරඹීමට සතුන් සියල්ලන්ම පෙළ ගැස්සුවා. මී මැස්සා එම ස්ථානයට වී ඉගිලෙමින් සිටියා. ඔහු තරඟකරුවකුට වඩා විහිළුකාරයකු ලෙස දිස්වුනා. තරඟය ආරම්භ කළා. අශ්වයා වේගයෙන් දුවන්න පටන් ගත්තා. නමුත්, වෙනදා දුවන අධික වේගයෙන් නම් නොවෙයි. මොකද ඔහුට තරඟයක් දීමට තරම් වෙනත් තරඟකරුවන් හිටියේ නැහැ. මී මැස්සා වේගයෙන් ඉගිල ගොස් අශ්වයාගේ හොම්බ උඩ වාඩි වුනා. පසුපසින් අශ්වයාව හබා එන සතුන්ට විහිළු කරමින් අශ්වයා දුවනවා. අශ්වයාගේ හොම්බ උඩ මී මැස්සා සිටින නිසා අශ්වයාට අපහසුතාවයක් දැනුනා. අශ්වයා හොම්බ ගසා දැම්මත් මී මැස්සා කිසිම ගානක් නැතිව හිටියා. අශ්වයා දිනුම් කණුව වෙත ළඟා වුනා. එවිටම අශ්වයාගේ හොම්බෙන් ඉවත්වී මැස්සා ජයග්‍රාහකයා බව පෙන්නුවා. නරි බිරිඳ මී මැස්සා තරඟය පළමුවෙන් නිමා කරනවා දැක මී මැස්සා ජයග්‍රාහකයා වශයෙන් නම් කළා. මේ තීරණයට අශ්වයා එකඟ වුනේ නැහැ. මේ තීරණය ගැන ප්‍රශ්න කරන්න බැහැ. "විනිශ්චයකරුගේ තීරණය අවසාන තීරණයයි" නරි බිරිඳ කිව්වා. ඉන් පසුව අශ්වයා මේ ගැන රජු වන සිංහයාට පැමිණිලි කළා. එහිදී, සිංහයා කිව්වා "මම රජු වුනත් තීරණය වෙනස් කරන්න බැහැ. අනික මම වෙනස් කරන්න කියලා බලපෑම් කරන්නෙත් නැහැ" (මිනිසුන් අතරත් මේ තත්වය සම්පූර්ණයෙන්ම වෙනස් නේද?)

අවසානයේදී තරඟයේ ප්‍රධාන සංවිධායක වන නරියාත් ඔහුගේ බිරිඳත් තීරණය කළා කුඩා මී මැස්සා තරඟය ජයග්‍රහණය කළ බව. පසුව කැලේ රජා සිංහයා අභියෝගතා කුසලානය මී මැස්සාට පිරිනැමීමට සූදානම් වුනා. එවිට මී මැස්සා කිව්වා මට ඔය කුසලානය පිළිගන්න බැහැ කියලා. විශ්මයට පත් සිංහයා එයට හේතුව විමසුවා. "ඒකට හේතු දෙකක් තියෙනවා" මී මැස්සා කිව්වා "පළමු හේතුව තමයි මට ඔය කුසලානය උස්සගෙන යන්න බැරිකම. අනික තමයි මම ජයග්‍රාහකයා උනේ නීතිරීතිවලට පටහැනිවයි. මම දුවන්නේ නැතිව අශ්වයාගේ හොම්බ උඩට වෙලා හිටියේ. නියම ජයග්‍රාහකයා අශ්වයා. එයාට කුසලානය පිරිනමන්න. මගේ විරුද්ධත්වයක් නැහැ. මේක අහපු සතුන් ඔක්කොම සමච්චලයට හිනාවෙන අතරම මී මැස්සාට ප්‍රීතිඝෝෂා කළා.

■ මේජර් සුනිල් තිලකරත්න (විශ්‍රාමික)
2 ශ්‍රීලංසිරෙ

කෙටිකතාව



# කන්‍යාවගේ කතාව

ඔහුගේ සේනා බළඇණිය අනුක්‍රමයෙන් හීනවූයේ ජෙනරාල්වරයාට පහත අණ නිකුත් කරනු විනා ගතහැකි අන් තීරණයක් නොවීය.

"සෙබළුනි, අප දැන් වෙන යම් නගරයක් කරා පලායාම මිස කළහැකි අන් කිසිඳු දෙයක් නොමැත. එහිදී, අප තව උපක්‍රමයක් යොදා සතුරාට පහර දෙමු. දැන් සතුරන් අතින් ජීවිතක්ෂයට පත්වීම අඥාන ක්‍රියාවකි. එබැවින් කාන්තාර හරහා ගමන් කරමු. අතරමගදී හමුවන කන්‍යාරාමවලද, තාපසාරාමවලද ලැගුම් ගෙන අපේ ආහාරපානාදිය පිළියෙල කර ගනිමු"

සේනා බළඇණියද කළහැකි අන් දෙයක් නොවූයෙන් එම තීරණය හා එකඟ විය.

දින හතරක් මුළුල්ලේ කාන්තාරය හරහා අඛණ්ඩ ගමනක යෙදුණු ඔවුහු අධික සූර්යතාපයෙන්ද, කුසගින්නෙන්ද, පිපාසයෙන්ද පීඩිත වූයේ දිගක් කොටු තාප්පයකින් වටවූ පැරණි බලකොටුවක හැඩරුව ගත් ගොඩනැගිල්ලක් දැක මහත් සතුටට පත්වූහ. එම දර්ශනය ඔවුන්ගේ හදවත් සංතෘප්තියට පත්කළේ කන්‍යාරාමයක් විය හැකි බැවින් තවාතැන් ගෙන ආහාරපානාදිය සපයා ගත හැකි වේයැයි සිතූ බැවිනි.

ගේට්ටුව විවෘත කළද කිසිවකු හමුවීමට නොපැමිණි හෙයින් ඔවුන්ගේ බලාපොරොත්තු සුන්වූ නමුත්, මද වේලාවකින් මුහුණ පමණක් විවෘත වන සේද, සිරුරේ අනෙක් කොටස් සම්පූර්ණයෙන්ම වැසියන සේද, කළු ලෝගුවකින් සැරසුණු කාන්තාවක් ඔවුන් ඉදිරියේ දෘෂ්‍යමාන විය. ඔවුහු ඉමහත් සතුටට පත්වූහ.

**සෙබළුනි, අප දැන් වෙන යම් නගරයක් කරා පලායාම මිස කළහැකි අන් කිසිඳු දෙයක් නොමැත. එහිදී, අප තව උපක්‍රමයක් යොදා සතුරාට පහර දෙමු. දැන් සතුරන් අතින් ජීවිතක්ෂයට පත්වීම අඥාන ක්‍රියාවකි.**



ඔවුන් දැනට පත්ව ඇති අසීරු තත්වය ඇට විස්තර කරදීමෙන් අනතුරුව කන්‍යාරාමයේ වෙසෙන සිල්මාතාවන්ට කිසිදු හානියක් නොකරන බවත්, පොරොන්දු වීමෙන් අනතුරුව කන්‍යාරාමය කෙලවර වූ උද්‍යානයේ ලැගුම් ගැනීමට අවසර දෙන ලදී. ඔවුන්ගේ ආහාරපානාදියද ඇය විසින් සපයන ලදී.

සේවා බලඇණියේ අණදෙන නිලධාරියා අශ්ශීල ගති පැවතුම් ඇති සල්ලාලයකු වූයේ ඔහුගේ දැවෙන ශරීර තාපය සංසිඳුවාලනු වස්, කාන්තාවකගේ පහස තමා වෙත පොලඹවා ගැනීමේ අදහසක් උපනි. ඔහුගේ මෙම අශ්ශීල සිතුවිලි මාලාව කෙතරම් ප්‍රබල ලෙස ඔහු ග්‍රහණය කර ගත්තේද යත් දූෂිතවූද, වනාජවූද, දුවනමය ලෝකයෙන් අභිනිෂ්ක්‍රමණය කොට ශුද්ධ වූ දෙවියන් ඉදිරියේ යාඥා කරමින් සිටි සිල් මාතාවන්ට නිවහන වූ පූජනීය කන්‍යාරාම භූමිය පාපයෙන් අපවිත්‍ර කිරීමට ඔහු පෙළඹවීය.

ජනේලය තුලින් එක්තරා කන්‍යා සොයුරියක දුටුයේ, පාලිකාවට හොර රහසේ ඔහු ඉණිමග දිගේ කාමරය තුලට පිය නැගුවේය. හුදකලා ජීවිකාවක් අවුරුදු ගණනක් තිස්සේ කරන ලද නිරන්තර සුරූපී ලලනා ලාවණ්‍යය මැකුනු ක්ෂය කොට තිබුණේ නැත. පාපකාරී ලෝකයේ අනාථයකු ලෙස මෙහි ප්‍රවිශ්ට වූ ඕ මෙසේ දෙවියන් ඉදිරියේ යාඥා කරමින් සිටියේ පාපකාරී ලෝකයෙන් සනාතනිකව එතෙරවීමේ අදිටනෙනි.

කාමරයට ඇතුළු වූ සැනින් කොපුවෙන් කඩුව ඇදගත් හේ අනුන්ගේ උදව් ඉල්ලා ඝෝෂා කළහොත් ඇ මරණ බවට තර්ජනය කළේය.

ඇ ඔහුගේ කැමැත්තට අවනත වන බවක් පෙන්වා නිශ්ශබ්දව සිනාසී

**කාමරයට ඇතුළු වූ සැනින් කොපුවෙන් කඩුව ඇදගත් හේ අනුන්ගේ උදව් ඉල්ලා ඝෝෂා කළහොත් ඇ මරණ බවට තර්ජනය කළේය. ඇ ඔහුගේ කැමැත්තට අවනත වන බවක් පෙන්වා නිශ්ශබ්දව සිනාසී "වාඩිවෙන්න ඔබට මහන්සියි" පැවසුවාය.**

"වාඩිවෙන්න ඔබට මහන්සියි" පැවසුවාය.

"මම ඇත්තවශයෙන්ම ඔබවන් වීර සොල්දාදුවන් කෙරෙහි අපිරිමිත කරුණාවක් දක්වනවා. ඒ ඔබ නිතරම සිටින්නේ මරණයේ දොරටුව අභියස නිසයි"

මෙයට අඥාන බියගුල්ලා මෙසේ පිළිතුරු දුනි. පරිසරය විසින් අප අනිවාර්යයෙන් මේ තත්වයට පත්කළා මිස මා සොල්දාදුවකු වූයේ කැමැත්තට නොවේ. මිනිසුන් මට බියගුල්ලා යැයි අපහාස නොකරන්නේ නම් මම මගේ කැමැත්තෙන්ම මෙම සේවා බලඇණියෙන් පලායමි.

ඔහු වෙත මඳ සිනාවක් පෑ ඇ මෙසේ පැවසීය. මෙම ශුද්ධ වූ ස්ථානයේ එක්තරා ධූපයක් ඇත. එය ඇග ගල්වා ගත්තකු කිසිම කඩු පහරකින් ඡේදනය නොවේ. ඔබත් මෙම ධූපය ගැල්වීමට අකමැතිද? එවිට කිසිම කඩු පහරකින් ඔබ නොමියෙනු ඇත.

"කවර විශ්මයක්ද? ඒ ශුද්ධ වූ ධූපය කොහේද? මම සදාකල් හිම අමරණීය වන්නම්."

"හොඳයි ඔබට එය දෙන්නම්"

එවන් මිථ්‍යාවක් විශ්වාස කරන යුගයක මිනිසා ජීවත් වූ හෙයින් ජෙනරාල්වරයා කන්‍යා සොයුරියගේ වචනය කෙරෙහි සැක ඉපදවූයේ නැත.

ඇය එක්තරා බඳුනක් විවෘත කොට එය තුළ වූ ශ්වේත ධූපයක් ඔහු වෙත පා නමුදු ඔහු එය කෙරෙහි සැක උපදවන්නට විය. ඉන් ධූපය ස්වල්පයක් අතට ගත් ඇ එය ඇගේ ගෙල වටා ආලේපනය කොට "දැන් ඔබට මෙම ධූපය පිළිබඳව සැක සිතේ නම්, ඔබේ කඩුව මගේ ගෙල මත තබා ඔබගේ මුළු වැර යොදා ගෙල සිඳලීමට උත්සාහ කරන්න. ඒත් එය ඔබට කළහැකි වන්නේ නැතැයි" පවසා සිටියාය.

මුලදී ඔහු මේ පිළිබඳව අකමැත්තක් දැක්වූයේ නමුදු ඇගේ බලවත් ඇවිටිල්ල පිට එයට එකග වූයේ ඔහුගේ කඩුව ඇගේ ගෙල මත තබා තම සිරුරෙහි මුළු වැර ඒ මත යෙදීය.

සැනෙකින් පොළොව මත පතිත වුණු ඇගේ හිස දුටු ඔහු අර්ධ සිහි මූර්ජාවට පත් වූයේය. පිවිතුරුභාවය ආරක්ෂා කරගනු වස් ඇය යෙදූ උපක්‍රමය අවබෝධ වූයේ එවිටය.

කන්‍යා සොයුරිය මළේය. ඇගේ අජීවී හිසත්, කබන්ධ රූපයත්, ධූප බඳුනත් ජෙනරාල්වරයා ඉදිරියේ දිස්විය. ඔහු සිහිවිකල් වූයේ ලේ තැවරුණු කඩුව ඉදිරියට හෙරා "ඉක්මන් කරනු...වහා මෙතනින් පලා යමු" යි උද්‍යාන කෙළවරටම ගොස් මොර දුන්නේය.

උන්මත්තකයකු සේ පලායන ඔහු දුටු ඔහුගේ සේවායෝ ඔහු ඉදිරියට පැමිණි විට "මම ඇය මැරුවා" යැයි කුඩා ළමයකු සේ ඉකි බින්දේය.

උපුටා ගැනීම -

ඛලිල් ජිබ්රාන්ගේ කතාවක් අනුවාදය කොට සත්‍යපාල ගල්කැටිය විසින් රචිත "කල්පනා" කෘතිය ඇසුරිනි.



# මනසට දැනෙන පීඩාකාරී, වෙහෙසකාරී හැඟීම

# මානසික ආතතියද?

අපගේ මනස අපව මෙහෙයවන ස්වභාව ධර්මයාගේ අපූර්ව තිළිණියක්ය. එකී මනස යහපත් ලෙස පවත්වාගෙන යාම පුද්ගලික හා රාජකාරී ජීවිතයට මහත් සේ වටින්නේ අප කරන සෑම ක්‍රියාවකටම මනසේ තිබෙන එම අවස්ථාවේ තත්වය බලපාන නිසාම වේ. ඒ අනුව වර්තමානයේ මිනිසාගේ කාර්ය බහුලත්වය නිසාම මානසික ආතතිය යන මාතෘකාව කරලියට පැමිණ තිබේ. සත්‍ය වශයෙන්ම ඔබ මනසට දැනෙනා අපහසුකාරී එම හැඟීම මානසික ආතතියමද?

බොහොමයක් දෙනාට මානසික ආතතිය ඇති වන්නේ අධික කාර්ය බහුලත්වය තුළ අනවශ්‍ය ලෙස සැලසුම් කර ඒවා පිළිබඳව නිතර නිතර තැවීම හේතුවෙන් වේ. ඒ සඳහා අප නිරන්තරයෙන් වර්තමානයේ ඵලදායීව ජීවත්වීමට අපගේ මනස පුරුදු කළ යුතුය. ඔබගේ දවසේ තිබෙන කුඩා කුඩා සතුට තිබෙන අවස්ථා සෑමවිටම විඳිය යුතුය. ඔබ ඉතාමත් සුන්දර සීත පලාතක විනෝද චාරිකාවක් යන විට වීදුරු අඳුරු කළ වාහනයක ඉතා දුර ගෙවා ගෙන මහන්සියෙන් ගොස් එකවරම එම ස්ථානයේ සිට ගන්නා විට දැනෙන හැඟීමට වඩා චාරිකාව යන අතරතුර පරිසරයේ සුන්දරත්වය විඳිමින් සීතල විඳිමින් ගොස් එම ස්ථානයට ලඟාවන විට දැනෙන හැඟීම බොහෝ වෙනස් වේ. මන්ද, සාර්ථකත්වය ගමනක් මිස ගමනාන්තයක් නොවන බැවිනි. ඒ අනුව අප සෑමවිටම ගෙවන ජීවිතය විඳිමින් ගෙවිය යුතුය.

ලෝක ප්‍රසිද්ධ නලු විගෝ මොර්ටෙන්සන්ට අනුව ඔහුට මානසික ආතතිය පිළිබඳ වටිනාම උපදෙස ලබාදී ඇත්තේ අශ්වාරෝහකයෙක් විසිනි. එනම්, "වේගයෙන් යන්නට නම් සෙමින් යන්න" යන්නයි. සාවධානව බැලූ කළ එය සැබෑ සත්‍යයකි. අප සෑමවිටම ජීවත් වන්නේ අපට ජීවත්වීමට දවසේ පැය ගණන මදිවේයැයි හැඟීමකින්ය. නමුත්, කරන කාර්ය පෙළ ගස්වාගෙන ප්‍රමුඛතාවයකට අනුව සන්සුන්ව, වැඩි අවධානයකින් කළහොත් ආතතියකින් තොරව ඵලදායීව කාර්ය නිමකළ හැකිය. වැඩි සැලකිල්ලකින් යුතුව එක් කාර්යයක නියැලෙන විට එම කාර්යයේ ඵලදායීතාවය ඉහළ යන බව සැබැවින්ම නොරහසකි. සැලකිල්ල පිළිබඳව කතා කිරීමේදී ලෝක ප්‍රසිද්ධ ධනවතෙක් වන ඇමේසන් වෙබ් අඩවියේ නිර්මාතෘ ජෙෆ් බෙසෝස් එය පිළිබඳව ප්‍රසිද්ධ මාධ්‍ය සාකච්ඡාවක මෙසේ ප්‍රකාශකර ඇත. "මානසික ආතතිය යනු, සැලකිල්ලක් දැක්විය යුතු දේවල් නොසලකා හැරීමෙන් හා නොසලකා හැරිය යුතු දේවල් පිළිබඳව සැලකිල්ලක් දැක්වීමෙන් ඇතිවෙන පීඩනයකි". ඔහු පවසන ආකාරයට මානසික ආතතිය ඇති වන්නේ කිරීමට නියමිත වැඩ වැඩිවන තරමට නොව පටන්ගත් කාර්යය අවසන් නොකිරීමෙන් වේ. මෙය විද්‍යාත්මකව සනාථ වන්නේ අපගේ මොළය සෑමවිටම සෑම ක්‍රියාවක්ම කරනු ලබන්නේ පුද්ගලයාගේ ආරක්ෂාව සඳහායි. එවිට අප මොළයට කිරීමට නියමිත වැඩ කිහිපයක් පිළිබඳව විධානය ලබාදී එම කාර්යය සිදුනොකළ විට මොළය නිතර නිතර එය මතක් කරමින් සිහියට නංවමින් අපට සංඥා කරනු ලබයි. අප එය දිගින් දිගටම කල් දැමීමෙන් මොළය වෙහෙසට පත්වේ. තවද, ඇඩි කාර්යය බහුලත්වය නිසා අපගේ මූලික අවශ්‍යතාවන් හට බාධාවන් සිදුවන විටද මොළය මානසික ආතතිය මගින් සංඥාවක් ලබාදෙමින් අපට කියනුයේ කෙටි විවේකයක් හෝ රැගෙන සන්සුන් විය යුතු බවයි.

මෙකී මනසේ ඇතිවන මෙම පීඩාකාරී තත්වය මිනිසකු තුළින් පහත ආකාරයට පෙන්නුම් කරයි. එනම්, නිතර නිතර තරහ යෑම, කෑම අරුචිය, නින්ද නොයෑම, අධික හිසරදය හා කෙටි කාලීන මතක අමතක වීම මෙයින් කිහිපයක් වේ. ඒ අනුව මෙම මානසික ආතතිය වැඩ කරන මිනිසකුට සාමාන්‍ය වේ. තීරණාත්මක යම් දෙයක් පටන් ගෙන කරගෙන යන විට සෑම මොහොතකම මානසික ආතතියක් දැනීම තුළින් එම කාර්යය පිළිබඳව මනා අවධානයක් තබා ගැනීමට හැකියාවක් ඇති අතර, එවැනි දිනවලදී එම දිනය මඳ වේලාවක් කලින් පටන් ගැනීම තුළින් මෙය මගහරවා ගත හැකි වේ. නමුත්, මෙම හැඟීම තරමක් පීඩාකාරී වෙහෙස කරවීම නිසා එම අවස්ථාවන්වලදී අදාළ කාර්යය හෝ පීඩනය ගැන සිතමින් තැවෙමින් සිටීම සිදුනොකළ යුතු අතර, එවන් අවස්ථාවලදී මඳක් අසුනෙන් නැගිට එළිමහනට ගොස් නැවුම් හුස්ම ටිකක් ගැනීම, මුහුණ මඳක් සෝදා ගැනීම, සීතල වතුර වීදුරුවක් හෝ වෙනත් සැහැල්ලු රසවත් පානයක් ගැනීම, සියලු වැඩ නතර කර ශරීරය හා මනස නිදහස් කර විනාඩි කිහිපයක් පරිසරය දෙස බලා සිටිමින් මනසට නිදහසේ සිතුවිලිවලට සැරිසැරීමට ඉඩදීම වැනි සරල ක්‍රියාකාරකම් තුළින් මෙම මානසික ආතතිය නැති කර ගැනීමට හැකියාව ලැබේ. අපගේ මනස සෑම විටම අහසට සමාන කළ හැකිය. අපගේ හැඟීම් එහි තිබෙන වලාකුළු වැනිය. සෑමවිටම අහසට වලාකුළු ඒම සහ යෑම සිදුවේ. එමෙන්ම, කළු වලාකුළු වැනි නරක හැඟීම්ද මනසට ඒම සහ යෑම සිදුවේ. නමුත්, වලාකුළු අහසේ එකම තැන තිබෙන්නේ නැත. ඒ වගේම මනසේද හොඳ හෝ නරක කිසිඳු හැඟීමක්ම ස්ථිරවම නොපවතී. එම නිසා වර්තමානයේ ජීවත් වෙමින් ජීවිතයේ සතුට විඳිමින් එන යන හැඟීම් පිළිබඳව නොතැවෙමින් සිටීමෙන් තම පුද්ගලික හා රාජකාරී ජීවිතයන්ට පීඩාකාරී වන මෙම ආතතිය සාර්ථකව නැති කිරීමට මෙයින් හැකි වනු ඇත.



2/ලුතිනන්
එන්කේඑල්එස් බණ්ඩාර ශ්‍රීලංකාආබමු



# ජීවිතයට සුබවාදී බැල්මක් හෙලන්න


තාවකාලික වූ මේ සොඳුරු ජීවිතය තුළ සතුට රැඳී ඇත්තේ ඔබ ලෝකය දෙස බලන ආකාරය අනුවය. ඔබ තුළ සිටිනා ඔබ අවදි කරන්න උත්සාහ කරන්න. තමන් තුළින් තමන් දකින්නට තමන් මෙන්ම අනෙකා පිළිබඳව ධනාත්මක සිතුවිලි වර්ධනය කිරීමට උත්සාහ කරන්න.

## විශ්ව ආර්ෂන නීතිය කියන්නේ මොකක්ද?

ආගම්, ජාති, වයස් භේද නොසලකා අපි හැමෝම මේ විශ්වය පාලනය කරනු ලබන නීතිවලට යටත් වේ. එනම්, මේ සමස්ත විශ්වයම පාලනය කරනු ලබන ඇසට නොපෙනෙන නීති සමුදායක් විය. ඒ නීති සෑම එකක්ම මේ ලෝකයේ ජීවත්වන සෑම ජීවියකුටම එක හා සමානය. ඉතින් මේ විශ්ව පාලනය කරන නීතීන් අතරින්, එක නීතියක් තමයි *Law of Attraction* නැතහොත් විශ්වයේ ආකර්ෂණීය නීතිය. මේ *Law of Attraction* නීතියට අනුව කටයුතු කළොත් තමන්ට අවශ්‍ය ඕනෑම දෙයක් ඉතාමත් පහසුවෙන්ම තමන් වෙත ළඟාකර ගැනීමේ ශක්තිය පවතී. මේ කියන සිද්ධාන්තයේ සැබෑ ගැඹුර මොන වගේද යන්න ගැන අවබෝධය ඇති පිරිස බොහෝ අඩුයි. නමුත්, එය දැනගෙන සිටීම තුළින් ඔබ සැමදෙනාට බොහෝ ප්‍රයෝජනය ලබාගත හැකිය. කෙසේවෙතත්, අප දැන නොදැන අප ගෙවන මේ හැම තත්පරයකම හොඳ හෝ නරක මේ විශ්වයට මුදාහරිනවා. ආකර්ෂණ නීතිය තුළ අප විසින් ඇතිකර ගන්න සිතුවිලි පවා අපිට හොඳ හෝ නරක ආකර්ෂණය කිරීමට බලපානු ලබනවා.

මේ විශ්වයේ ආකර්ෂණ පිළිබඳ නීතිය වසර දහස් ගණනකට කලින් විශ්වය නීතිය පිළිබඳව ඉගැන්වූ පළමු ශාස්තෘවරයා ලෙස බුදුරජාණන් වහන්සේ හැඳින්වෙයි. අප සිතන පතන දේ අනුව අපේ ජීවිතය ගතකරන්නට සිදුවේ. මෙම සංකල්පය බටහිර සංස්කෘතිය තුළට පැමිණීමත් සමඟ එය කර්ම *(Karma)* යන නමින් ලෝකයේ ප්‍රචලිත විය.

මෙලොව වෙසෙන කිසිවෙක් දුර්වල නැත. පහත් නැත. ඒ සියල්ලම පාලනය කරනු ලබන්නේ මනසයි. මේ මනස තුළ යහපත් සිදුවිලි, ධනාත්මක සිතුවිලි වර්ධනය කිරීමට නිතර උත්සාහ කර යුතුය. මෙවැනි සුභවාදී ආකල්ප, ක්‍රියාශීලී බව, ආදරය වැනි දේවල් අපේ ජීවිතයට සුභවාදී ප්‍රතිඵල ආකර්ෂණය කරදෙයි. මේ නිසා සැමවිටම තමන්ගේ මනස තුළ ධනාත්මක සිතුවිලි රෝපණය කරන්නට උත්සාහ කරන්න. ඒ තුළින් ඔබට ඔබ විසින් ප්‍රාර්ථනා කරනු ලබන සෑම දෙයක්ම ඉතාමත් පහසුවෙන් තමන්ගේ ජීවිතයට ආකර්ෂණය කරගැනීමේ හැකියාව ලැබෙයි.



ලුතිනන්
එච්ඩබ්එච් කුලසිරි ගෙර

# වර්තමාන සමාජයේ දෙමාපියන් හා ඔවුන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම්

**ඔවදනක්**

අද සමාජයේ දැකිය හැකි ප්‍රශ්නයක් නම්, දෙමාපියන්ගේ දාරක සෙනෙහස හීනවීමයි. මෙහිදී, දරුවන්ගේ භෞතික අවශ්‍යතාවන් පමණක් නොව ඔවුන්ගේ ආධ්‍යාත්මික හා මානසික වර්ධනය ගැනද මව්පියන් සැලකිලිමත් විය යුතුය. දරුවන්ට අවශ්‍ය ප්‍රමාණයට වඩා භෞතික සැප සම්පත් ලබාදුන්නත් ඔවුන්ට අවශ්‍ය දයාව, කරුණාව, මෛත්‍රිය, සෙනෙහස ලැබෙන්නේ නැත්නම් එම පවුල්වල දරුවන්ට මානසික හා අධ්‍යාත්මික වර්ධනයක් නොලැබී යනු ඇත. එම නිසා තම දරුවන්ගේ භෞතික අවශ්‍යතාවන් මෙන්ම දයාව කරුණාව ආදරය නිසි ලෙස ලබාදීමෙන් හොඳ දරු පරපුරක් බිහි කරගත හැක.

මෙහිදී, දෙමාපියන් කෙරෙහි බාහිර සමාජයෙන්ද, දරුවන්ගෙන් ද ඇතිවන පීඩනය, මව්පිය දෙදෙනාගේ ඇතිවන ගැටුම්වලින් ඇතිවන පීඩනයද දරුවන් මගින් තොයවා මනා දරාගැනීමේ හැකියාවකින් යුක්තව හොඳ අධ්‍යයනයක් කිරීමටද, ඔවුන්ගේ ප්‍රශ්න කෙරෙහි නිසි අයුරින් බැලීමටද, නොහැකි වනු ඇත. එසේම, දරුවන්ගේ අධ්‍යාත්මික මෙන්ම භෞතික අවශ්‍යතාවන් නිසි අයුරින් ඉටුකිරීමට අපොහොසත් සමාජයට පරිපූර්ණ මිනිසකු දායාද කිරීමට නොහැකි වේ.

දෙගුරුවන් දරුවන් කෙරෙහි අනවශ්‍ය පීඩනයක් ඇති නොකළ යුතුයි. දරුවන් පිළිබඳ මනා අධ්‍යයනයක් නොකර ඔවුන්ගේ හැකියාවක් ගැන නොසලකා තම අරමුණු, උසස් රැකියාවක්, සමාජයේ හිණිපෙත්තට යාම, මුදල් හම්බ කිරීම වැනි කාරණා කරා දරුවන් මෙහෙයවීම තුළින් දරුවන්ට අනවශ්‍ය පීඩනයක් ගොඩ නැගේ. එයින් දරුවනට ජීවිතයේ සුන්දරත්වය අත්විඳීමට නොහැකි වනවා මෙන්ම අවබෝධය, කරුණාව, දයාව, ස්වභාව සෞන්දර්ය රස විඳීම වැනි දේ වර්ධනය කර ගැනීමට අවස්ථාවක් නොලැබී යයි.

දෙමාපියන් දරුවන්ගේ හැකියාවන් හඳුනාගත යුතුය. වැඩකට නැති පුද්ගලයන් මෙලොව නැත. ප්‍රශ්නය ඔහු කුමකට දක්ෂද යන්න හඳුනාගැනීමට හැකි පුද්ගලයකු නොමැති වීමය. මෙහිදී, දෙගුරුන් කෙරෙහි විශාල වගකීමක් පැවරේ. කුඩා කල සිට දරුවා පිළිබඳ මනා අධ්‍යයනයක් කර දරුවා අනාගතයේ කුමකට දක්ෂ වේදැයි මූලිකවම දෙමාපියන් තේරුම්ගෙන එම අරමුණ කරා දරුවා මෙහෙයවිය යුතුය. අනාගතයේ රැකියාව කුමක්ද? විවාහය කෙසේ විය යුතුද? ජීවිතය කෙසේ විය යුතුද? යන්න තේරුම් ගැනීමට ප්‍රාථමික අවධියේ සිටින දරුවකු සමත් නොවේ. එසේනම්, දෙමාපියන් දරුවා අධ්‍යයනය කර ඔහුගේ දක්ෂතාවන් කරා ඔහු මෙහෙයවිය යුතුයි. එසේ කිරීමෙන් හොඳ දරුවකු බිහිවන අතර, ඔහු කෙරේ අනවශ්‍ය පීඩනයක් ඇති නොවේ.

දෙමාපියන් වශයෙන් මොනයම් හෝ මොහොතක දරුවන්ට හරි වැරැද්ද කුමක්ද යන්න තෝරා බේරා ගැනීමට නොහැකි වන ආකාරයට නොහැසිරිය යුතුයි.



උදා :- තම සිඟිති දියණියට යාබද වත්තෙහි වැට අසල ඇති පොල් ගෙඩියක් වැටෙන් පැන අහුලාගෙන ඒමට උපදෙස් දෙන මව එම ක්‍රියාව අගය කිරීමක් කරයි. නමුත්, දිනක් පන්තියේදී අනික් ළමයාගේ පාට පෙට්ටිය බිම වැටී තිබී බැගයට දමාගෙන තියාගන්නා දරුවා එය ගුරුවරියට අසුවී සොරෙකු වේ. එහිදී, ගුරුවරිය දරුවාගේ මෙම හැසිරීම පිළිබඳව දියණියගේ මවට කී පසු මව දරුවාට තරවටු කරයි. මෙය මෙසේ නම් සිඟිති දරුවා කුමක් හරිද? කුමක් වැරදිද? යන්න තේරුම් ගන්නේ කෙසේද? මෙම ක්‍රියාවන් දෙකෙහි වෙනසක් නැත. එය එසේනම් දරුවා දෙලොවක් අතර තනි නොවේද? මානසික පීඩනයට ලක් නොවේද? එය එසේ නොවිය යුතුය.

අද සමාජයේ පියවරුනට මත්පැන්, දුම්වැටි හොඳ නැති බව ශාරීරික සෞඛ්‍යයට අහිතකර බව ආගමික ස්ථාන මඟින් හා වෙනත් ආයතනවලින් පෙන්වා දෙද්දී දරුවන් ඉදිරියේ මත්පැන් දුම්වැටි පාවිච්චි කරයි. මෙය මෙසේනම් දරුවන් හරි කුමක්ද? වැරැද්ද කුමක්ද? යන්න තේරුම් ගන්නේ කෙසේද? දරුවන් අනුකරණය කරන්නේ සමාජයද? දෙගුරුන්ද?

කිසිම මොහොතක දෙමාපියන් දරුවන් ඉදිරියේ අඬදබර නොකළ යුතුයි. ඔවුනොවුන්ට ගරු කළ යුතුයි. එකිනෙකා අගය කළ යුතුයි. ආදරය දයාව කරුණාව පෙන්විය යුතුයි. එවිට දරුවන් දෙමාපියන් අනුකරණය කරනු ඇත. එසේ වුවහොත් යහපත් දරුවන් බිහිවේ.

කුඩාකල සිටම තම දරුවන්ට තම දෙගුරුන්ගේ වටිනාකම ඔවුන්ගේ සෙනෙහසේ අගය දැනෙන්නට සැලැස්විය යුතුය. ඔවුන් එසේ නොවී ඔවුනොවුන් දෙගුරුන් බවට පත්වූ පසු තම දෙමාපියන්ගේ අගය නොදැනෙන්නට වුවහොත් දරුවන්ටද පසුතැවීම ඉතිරි විය හැක.

උදා :- එක් කලක තරුණ යුවලක් සිටියා මේ යුවල පදිංචිව සිටියේ සැමියාගේ මහළු පියාගේ නිවසේ. මාමණ්ඩි නිතර කෝපයට පත්වන කරදරකාරී පුද්ගලයකි. මේ යුවල ඔහුගෙන් නිතර කරදර පැමිණි නිසා එයින් බේරීමට ඔවුන් උපක්‍රමයක් යෙදුවා පුතා මහළු පියාව විශාල කූඩයක දමා එය කර පින්නාගෙන කැලයට ගෙන ගොස් දමා ඒමට පිටත්වුණා. ඒ අසල සිටි තරුණයාගේ පොඩි පුතා මෙසේ ඇසුවේය. තාත්තේ සීයාව කොහේ එක්කරගෙන යනවද? තම මහළු පියාව ඔහුගේ පාඩුවේ ටික දිනක් ගතකිරීමට කඳුකරයට ගෙන යන බව තරුණයා පැවසුවා. මඳ වේලාවක් නිහඬව බලාසිටි ඒ කුඩා දරුවා "අනේ තාත්තේ මතක් කරලා ඔය කූඩේ ආපසු ගේන්න ඕන. ඇයි පුතා මේ කූඩේ මොකටද?" තරුණ පියා විමසුවේය. "තාත්තා නාකි වුණහම තාත්තාවත් දාගෙන යන්න කූඩයක් ඕන වෙනවනේ?" යැයි දරුවා ඉතා අහිංසක ලෙස පිළිතුරු දුන්නා. තරුණයාට තම ක්‍රියාවේ බරපතලකම වැටහුනේ එවිටයි. (උපුටා ගැනීමක්)

ගෙදරදී අසංවර ලෙස හැසිරීම, අසභ්‍ය වචන පාවිච්චි කිරීම, දෙමාපියන්ට නොහොබිනා අතර දරුවන් ඉදිරියේ හැසිරෙන විට දෙමාපියන් කල්පනාකාරී විය යුතුය.

දෙමාපියන් වශයෙන් අඩුම තරමේ පන්සිල් පද පහ වත් රැකගත යුතුය. විනයගරුකව ආදර්ශමත් දෙමාපියන්

> **"දෙමාපියන් දරුවන්ගේ හැකියාවන් හඳුනාගත යුතුය. වැඩකට නැති පුද්ගලයන් මෙලොව නැත. ප්‍රශ්නය ඔහු කුමකට දක්‍ෂද යන්න හඳුනාගැනීමට හැකි පුද්ගලයකු නොමැති වීමය. මෙහිදී, දෙගුරුන් කෙරෙහි විශාල වගකීමක් පැවරේ. කුඩා කල සිට දරුවා පිළිබඳ මනා අධ්‍යයනයක් කර දරුවා අනාගතයේ කුමකට දක්‍ෂ වේදැයි මූලිකවම දෙමාපියන් තේරුම්ගෙන එම අරමුණ කරා දරුවා මෙහෙවිය යුතුය."**

හැටියට දරුවන් ඉදිරියේ පෙනී නොසිටියහොත් දියුණුව කෙසේ වුවත් තම පවුලේ විනාශයද? ආයතනවල විනාශයද? සමස්ත සමාජයේ විනාශයද? රටේ විනාශයද? ලෝකයේ විනාශයද? වැඩි ඈතක නොවනු ඇත.


කපිතාන් එන්ඩබ්ලිව්ජීඑස්එම් පෙරේරා




## ඔබේ ලිපි/නිර්මාණ අප වෙත එවන්න...

විශේෂාංග රාශියකින් සමන්විත නව මුහුණුවරකින් එළිදක්වන රණවිරුවාහි ඔබගේ ලිපි, නිර්මාණ වෙනුවෙන් වැඩි ඉඩකඩක් වෙන් කෙරේ. ඔබ ඇසූ දුටු අත්විඳි ඕනෑම දෙයක් නිර්මාණශීලිව අප වෙත ලියා එවන්න. එසේ එවනු ලබන කවි, නිසඳැස්, කෙටිකතා, ලිපි හා ඡායාරූප ආදිය (සුදුසු ඒවා) අප්‍රමාදව රණවිරුවාහි පළකිරීමට කටයුතු යොදා ඇත. ඔබේ නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක
"රණවිරුවා"
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.
විද්‍යුත් තැපැල් ලිපිනය - ranaviruwa@yahoo.com



# දේශය බේරාගැනීම සඳහා වූ වළගම්බා රජුගේ විමුක්ති සටන

දුටුගැමුණු රජුගෙන් පසු එතුමාගේ සොහොයුරු සද්ධාතිස්ස රජ වූ අතර එම රජුගෙන් පසු ඔහුගේ පුතුන් වූ ලජ්ජිතිස්ස හා චුල්ලත්තන කුමරු අතර සිහසුන හිමිකම සඳහා සටනක් ඇති විය. චුල්ලත්තන රාජ්‍ය පැහැර ගෙන දින 40 කට පමණ පසු ඔහු පරදවා ලජ්ජිතිස්ස රජ වුණි. ලජ්ජිතිස්ස රජුගේ ඇවෑමෙන් පසු චුල්ලනාග රජ වූ අතර එම රජු මරා මහරගිතා නම් සෙනෙවියා විසින් රාජ්‍ය පැහැරගෙන ටික දිනක් රජ කම් කළද ඔහු මරා සද්ධාතිස්ස රජුගේ පුත් වට්ටගාමිණී අභය හෙවත් වළගම්බා ක්‍රි.පූ. 103 දී රජ විය. මෙකල රටේ පැවති දේශපාලන ගැටුම් නිසා වලගම්බා රජුටද වැඩිකල් රජකම් කරන්නට නොහැකි විය. ඔහු රජ වී මාස 5 ක් පමණ ගත වන විට රුහුණේ නකුල නගරයෙහි තිස්ස හෙවත් තීය නම් බ්‍රාහ්මණයෙකු විසින් රජුට විරුද්ධව කැරැල්ලක් දියත් කරන ලදී. එසේම ඊට සමගාමීව දකුණු ඉන්දියානුවන් හත්දෙනෙකුගේ නායකත්වයෙන් යුත් සේනාවක් විසින් අනුරාධපුරය ආක්‍රමණය කරන ලදී. පුලහත්ත, බාහිය, පනයමාර, පිලියමාර, හා දාඨික ආදී වූ ද්‍රවිඩයින් මහ සේනාවක් සහිතව මහතොටට ගොඩ බැස්සාහ. රජු උපක්‍රමශීලීව තීය බමුණා ද්‍රවිඩයින් හා සටනට යොමු කරන ලද අතර එහිදී ඔහු මිය ගියේය. ජයග්‍රහණයෙන් උදම් වූ ද්‍රවිඩයෝ අනුරාධපුරය දෙසට ගමන්ගත් අතර එහිදී වට්ටගාමිණී රජු ඔවුන් සමඟ සටන් කළත් පරාජයට පත් වූවේය. මේ ආක්‍රමණ නිසා වලගම්බා රජු ආරක්ෂාව පතා මලය ප්‍රදේශයට පැන ගිය අතර එහිදී තම දෙවු සොහොයුරාගේ බිසව වූ ගැබ්බර අනුලා දේවියත් ඇයගේ පුතුන් දෙදෙනාත් රැගෙන ගියහ. මෙහිදී රථයේ බර අඩු කර අනෙක් අයට පැනයාමට අවකාශ සළසනු සඳහා රජුගේ බිසව වූ සෝමා දේවිය සිය කැමැත්තෙන්ම රථයෙන් බැස්සාය. ආක්‍රමණිකයන් හත්දෙනාගෙන් එක් අයෙක් රජුගේ බිසව වූ සෝමා

දේවියද, තවත් ආක්‍රමණිකයෙක් බුදුන් වහන්සේගේ පාත්‍රා ධාතුවද රැගෙන ආපසු ඉන්දියාවට ගියේය. එය මහාවංශයේ සඳහන් වන්නේ මෙසේය.

"දෙමළුන් සත් දෙනා අතුරෙන් එකෙක් රූමත් සෝමා දේවිය දැක රාගයෙන් රත්ව ඇය ගෙන වහා පරතෙර ගියේය. එකෙක් අනුරාධපුරයෙහි තිබූ බුදුනු පය ගෙන එයින් සතුටු වූයේ වහා පරතෙර ගියේය."

ඉන්පසු ඉතිරි නායකයින් පස් දෙනා එකිනෙකා මරා ගනිමින් රජකම් කරන්නට විය. පුලහත්ථ වසර 3 ක් රජ කළ අතර ඔහු මරා ඔහුගේ සේනාපති වූ බාහිය වසර 2 ක් රජකම් කළේය. ඉන්පසු පනයමාර වසර 7 ක් ද, පිළියමාර මාස 7 ක් හා දාඨික වසර 2 ක් වශයෙන් එකිනෙකා මරා ගනිමින් රජකම් කළහ. වලගම්බා රජු මාතුවේල ගසාමගල්ල නම් ස්ථානයක විසූ තණසිව නම් ජනපද නායකයෙකු වෙත තුදුස් වසක්ම නැවතී ආරක්ෂාව ලබමින් යුද්ධ සේනාව සහ අවි ආයුධ සූදානම් කරගත්තේය. පසුව දාඨික ඇතුලු ඔහුගේ සේනාව විනාශ කොට අනුරාධපුර රාජ්‍ය බේරා ගෙන සිංහාසනය අත්පත් කර ගන්නා ලදී. ද්‍රවිඩයෝ වසර 14 තුන් මාස 7 ක් අනුරාධපුරයේ බලය පවත්වාගෙන ගියෝය.

අනුරාධපුර රාජධානිය ද්‍රවිඩ ආක්‍රමණිකයන්ට යටත්ව තිබූ කාලයේ රටේ දුර්භික්ෂයක් පැවතියේය. දොලොස් වසරක් තිබූ මෙම සාගතය, බැමිණිතියාසාය නමින්ද ව්‍යවහාර වන අතර ආක්‍රමණිකයින් හා අභ්‍යන්තර කැරලිකරුවන් වැව් අමුණු ආදිය විනාශ කිරීම මුල් කොටගෙන සාගතය හටගන්නට ඇතැයි අනුමාන කෙරේ. දුර්භික්ෂය නිසා භික්ෂූන් වහන්සේද මහත් දුෂ්කරතාවන්ට මුහුණදුන් අතර මේ වන විට සිතුල්පව්ව වැනි ආරාම සංකීර්ණයන්හි වැඩ වාසය කළ භික්ෂූන් වහන්සේ අතරින් ඇතැම් භික්ෂූහු අසල්වැසි රටවලට වැඩම කළහ.

වසර 14 කට අධික කාලයක් විදේශ පාලකයින් කිහිප දෙනෙකු යටතේ තිබූ අනුරාධපුර රාජ්‍ය මුදාගෙන රට එක්සේසත් කළ වලගම්බා රජුගේ සටන් සංවිධානය හා දුටුගැමුණු රජුගේ විමුක්ති සටන් සමඟ තුලනාත්මකව විමර්ශනය කිරීම වැදගත් වේ. දුටුගැමුණු රජු මුහුණ දුන් දුෂ්කරතාවලට වඩා වෙනස් ආකාරයේ දේශීය හා විදේශීය තර්ජනවලට වලගම්බා රජුට මුහුණ පෑමට සිදු වූ අතර එසේම ඊට සමගාමීව දරුණු සාගතයකටද මුහුණදීමට සිදු විය.

එළාරගේ පාලනයට විරුද්ධව සටන් කිරීම සඳහා කාවන්තිස්ස රජු විසින් යුද්ධ සේනා සංවිධානය කොට අවශ්‍ය මූලික පදනම සංවිධානය කර තිබූ හෙයින් දුටුගැමුණු රජුට අරමුණ කරා ගමන් කිරීමට බෙහෙවින් ප්‍රයෝජනවත් විය. ඒ වන විට එළාර වසර 44 ක් වැනි දීර්ඝ කාලයක් අනුරාධපුරය පාලනය කිරීම නිසා ඊට විරුද්ධව ජනතාව නැගීසිටීමත් දුටුගැමුණු රජුට අනුරාධපුරය නිදහස් කරගැනීමට තරමක් පහසු කරවන්නක් විය. නමුත් එළාර රජුට බලසම්පන්න ශක්තිමත් හමුදාවක් සිටි බව අමතක කළ යුතු නොවේ. වලගම්බා රජුට ද්‍රවිඩයින් හා සටන් කිරීම සඳහා දුටුගැමුණු රජුට තිබූ ශක්තිමත් හමුදා සංවිධානයක් හෝ සමාජ පරිසරයක් දැකිය හැකි නොවේ. තමා විසින්ම සේනා සංවිධානය කර ඔවුන් පුහුණු කරවා ඔවුන්ට අවශ්‍ය යුද්ධෝපකරණ ලබා දී විදේශ ආක්‍රමණිකයින්ගෙන් රජරට මුදා ගැනීමට ක්‍රියා කළේය. එහෙත් ඔහුගේ යුද්ධ ව්‍යාපාර හා ඔහු කළ සටන් පිළිබඳව මහාවංශයේ වැඩි විස්තර සඳහන් නොවීම ද සැලකිල්ලට භාජනය විය යුතු කරුණකි.

ආක්‍රමණිකයින්ගෙන් එක් අයෙකු රජුගේ බිසව වූ සෝමා දේවිය රැගෙන පලායාම රජුට සිත් වේදනා දුන් තවත් කරුණක් නොවූවා විය හැකිද. එසේම සතුරන්ගෙන් ආරක්ෂා වීම සඳහා අනුරාධපුර උතුරු වාසල දොරටුවෙන් පලා යන වලගම්බා රජු දැක මහා කළු සිංහලයා පලා යනවා කියා ගිරි නිඝන්ඨයා හඬගා පැවසූයේ ආක්‍රමණිකයන්ට රජුව අල්ලා ගැනීමට පහසු කරවීමට මිස වෙන කුමන කාරණාවකටද. ඒ අනුව සතුරන් පමණක් නොව අගනුවර සමීපයේ සිටි ආගමික පූජකවරුන් පවා රජුට එරෙහිව කටයුතු කළ බව පැහැදිලි වේ. කෙසේ නමුත් වෙස්සගිරියේ සැඟව සිට පසුව වෙස්වලාගෙන රුහුණට ගිය වලගම්බා රජු වහාම යුද සංවිධාන කටයුතු ආරම්භ කළේය. එහිදී රජු සේනාපතිවරුන් අට දෙනෙකු යටතේ සේනා සංවිධානය කරගෙන අවසන් ආක්‍රමණිකයා වූ දාඨික නම් නායකයාද ඔහුගේ සේනාවද පරාජයට පත් කොට අනුරාධපුරය නිදහස් කර ගත්තේය.

දකුණු ඉන්දීය චෝලයින්ට මෙරට ආක්‍රමණය කිරීමට අනුග්‍රහය සලසා ඇත්තේ ජෛනයින් බව ඇතැමුන්ගේ අදහසයි. කෙසේ වුවද එවකට රටෙහි පැවති දේශපාලන අස්ථාවර භාවය පිළබඳවත් අභ්‍යන්තර අරගල සබැඳිවත් තොරතුරු මගින් දුර්වල පාලන අවස්ථාවක් ඇති බව නිශ්චය කොට චෝලයින් විසින් අනුරාධපුර රාජ්‍ය ආක්‍රමණය කරන්නට ඇති බව නම් නිසැකය.

වලගම්බා රාජ්‍ය කාලය ආගමික වශයෙන්ද ඉතා වැදගත් වේ. සතුරන්ගෙන් ආරක්ෂා වීම සඳහා රාජකීය පවුල පලා ගොස් වනයේ සැඟවී සිටිද්දී පිණ්ඩපාතයෙන් ඔවුන් පෝෂණය කරමින් උපකාර කළ කුපික්කලතිස්ස නම් භික්ෂූන් වහන්සේ වෙත අභයගිරි නම් විහාරයක් කරවා පූජා කරන ලදී. තවද එතෙක් මුඛ පරම්පරාවෙන් පැවති ත්‍රිපිඨකය එසේ පවත්වාගෙන යාම අවධානම් බව වටහාගෙන ඒවා ලියා තබන්නට තීරණය කොට මාතලේ අලුවිහාරයේදී ග්‍රන්ථාරූඪ කිරීමද එම රාජ්‍ය සමයේ සිදු වූ තවත් වැදගත් ශාසනික සේවාවකි.

මෙකල රාජ්‍යත්වය පිළිබඳව රජ මැදුරේ අර්බුදකාරී ස්වරූපයක් හටගෙන තිබූ අතර වලගම්බා රජුගේ සොහොයුරියකගේ පුතුන් තිදෙනා වන තිස්ස, අභය හා ගිරි යන කුමාරවරු ගිරි නම් නිගන්ඨයාගේ ආධාර අනුබල ඇතිව රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් දියත් කරන ලදුව එම කැරැල්ල සාර්ථකව මැඩ පැවැත්වූ බවද එබැවින් ජෛනයින්ගේ අභිලාෂයන් නිෂ්ඵල වූ බවත් සඳහන් වේ. ඛල්ලාටනාග රජුගේ (ක්‍රි.පූ.109- 104) නැගෙණියක වූ සුමනා දේවියගේ පුතුන් තිදෙනා තම මාමා වූ ඛල්ලාටනාග මරා රජකම පැහැර ගැනීම සඳහා කළ කුමන්ත්‍රණය අසාර්ථක වීම නිසා අන් අය අතින් මැරෙනවාට වඩා ගිනිවැද මියයාම යෙහෙකැයි ගිරිනම් නිගණ්ඨයාගේ අසපුවේ ගිනි චිතකයට පැන දිවි නසා ගත් බව අප්‍රකට රහසකි. පසු කාලයේ මේ ස්ථානයේ වලගම්බා රජු විසින් ඔවුන්ගේ නම්වලින් අභ්‍යන්තර හෙවත් අභයගිරි නාමය තැබූ බව වංසත්ථප්පකාසනියෙහි සඳහන් වේ. එහෙත් මහාවංසයේ සඳහන් වන්නේ ගිරි නිගණ්ඨයාගේ ආරාමය මුලිනුපුටා දමා එම ස්ථානයේ රජුගේ නාමයේ කොටසකුත් ගිරි නිඝන්ඨයාගේ නාමයේ කොටසකුත් එක්කර අභයගිරි නම් චෛත්‍යයක් ගොඩනගන ලද බවය.

මේජර් සරත් ජයවර්ධන විසින් රචිත "ලක්දිව සංග්‍රාම ඉතිහාසය" ග්‍රන්ථයෙනි.



# සෙබළ සිතුවිලි

## යුධබිමේ ආදරය...

කාටවත් නොකියා හිතේ තද කරගෙන
තනියම දරාගෙන ඉන්න දුකක්
වේදනාවක් හමුදාවේ කොල්ලෙක්ගේ
ජීවිතේ අස්සෙන් තියෙනවා

නිවාඩුව අවසන් වෙන දිනේ
හදෙහි සන්තාප ගොඩනැගේ
පතිනි තනිකර යන දිනේ
සෙබළ සිත් වාවනු කෙසේ

රාජකාරිය දේවකාරිය ලෙසේ
ඉටු කිරිමයි සෙබළගෙ වගකීම උනේ
ආදරේ කැපකරන් යෞවනයේ
සෙබළ නැවතුම කඳවුරයි දිවිතුරේ

සෙ/532137
පාසෙ කුමාර ආර්බීයූපී - 8 විපාරෙ

## සැබෑ මිනිසකු වන්නේ...

සැබෑ මිනිසකු වන්නේ
පෙළපත් නාමය හෝ
ඇඳුමට විතරක් නොව
හදවතින් නැගෙන
යහපත් සිතුවිලි තුලිනුයි
චරිය තුලින්
ගෞරවය අගෞරවය
ලැබෙනවා සේම
මනුස්සකම ඇති
මිනිසතු බිහිවන්නේ
හදවතින් නැගෙන
යහපත් සිතුවිලි තුලිනුයි...

සෙ/524702
කෝප්‍රල් ලංසකාර ඒල්වච්වන්කේ

## පොතකි ඇය...

කියවන්න අකුරු බෑ
ඒ වුනත් පොත් ගොඩක්...
බදාගෙන හිඳිනවා
සල්ලි ඇති සලෙලුන්...
මල් මෙන්ම සුව ඇති
ඒ හැමම පොත් පිටුත්...
දකින විට වියරුවෙයි
හදවතේ මිනිසුන්...
කරන්නට කිසිත් නෑ
ඒ ඇගේ දෛවයයි...
කියවන්න දන්නෙ නෑ
පොතේ නම ගැහැනියයි...
එවන් උන් අතටවත්
නොයායුතු පොතකි ඈ...
කියවන්න දන්නෙ නෑ
පොතේ නම ගැහැනියයි...

ලුතිනන් කර්නල්
හේමන්ත රත්නායක ගරෙ

## බිය වූ මා බොළඳ සිත...

හදෙහි ගිනි ඇවිලෙනා
මේ අඳුරු සුයාමයේ
කෙසේ නම් කුමක්
කොහේ සිදුවේද යන වග
සිතාගත නොහැකි
මා බොළඳ වූ සිත තුළ

රිපුන් අඳුරු කළ
හිමල් ලක් මෑණිය
අඳුරු කළ පාස්කු දා සිට
බිය නමැති බිජුව
දිනෙන් දින දළු දමයි
මා බොළඳ වූ සිත තුළ

නැවත සාමය උදා වේ
මේ ලක් දෙරණ තුළ
දෙවිවරුන් වැඩි ඇත
සාමයේ හස්තය රැගෙන
මහ පොළවට
හඬ නෙතු සනහන්නට
හමුදු
කවදා හැකි වේද යන වග
නොහැගේ
මා බොළඳ වූ සිත තුළට

සෙ/279239
බනි 11 අතාවුද ඒච්චන්වස් යූවස්පී
7 ශ්‍රීලංසංබ

## මවනා සිහින...

මන්දාකිනියක අතරමං වී
මිරිඟුවක සේයා පෙනි පෙනී
ජීවිතය නම් වූ සොඳුරු නවාතැනක
මටම හිමියැයි සිතු ඔබේ ඔය රුව
මැකී යන්නට මත්තෙන්
මලක් පිපුණා මගෙ හද මඬල තුළ
යම් දෙයක් පවසයි මලේ අරුත ගැන
නුඹ සුරගනක් මගේ ලොව තුළ
දුටුවේ එක සිහිනයයි සැමදින
නුඹ මගේමයි මේ ජීවය තුළ

සෙ/කිච්104607
ලා/කෝ චන්තක චම්බිආර්

## මැදියම් රැය...

රොද මැදකට කොටුවූ ජීවිතය
සියලු දේ පවසයි රැහැයියන්ගේ නාදය
ඇස් පියන් වැසෙනා පොඩි කාලය
හිතට ඒ දෝ මැව් මැව් මතකය

තනි වූ මෙවන් වන කැළෑවක
අවිය විතරක් තනියට සිටි වෙලාවක
අවසානයක් නොමැති වනයේ සීමාවක
තනිකම මැකුවේ තුරුලිය හැම වෙලාවක

සිහින පොදි බැඳන් දකිනා සිහිනය
බොඳවී යාදෝ සැකයි හැමදෙය
අඩිය අඩිය තියනා හැම තත්පරය
අනතුරක් දෝ සිතට දැනෙයි මේ යාමය

සෙ/කිච්114562
සාසෙ පත්මසිරි ඒවස්ඩබ්ලිව

## අතීත සැමරුම්...

කඳුලු නැමැති සාගරයේ
සතුට නැමැති හබල අරන්
කඳුලු රළට පිටුපාමින් හබල් ගානවා
දුකට උරුම හද අරගෙන දිවිය ගෙවනවා

සහරැල්ලක් නැහැ හද තුළ
නුඹම දුන්නු කඳුලු රප්වෙලා
කාත් කවුරුත් නැහැ ළඟ
සුසුම්වලින් හදම පිරෙනවා
වේදනාව රැල්ල වැඩිවුණා

බිඳෙන දල රළට කියූ දුක
නැවතත් මා වෙතට ලංවෙලා
අතීත සැමරුම් ඔරුවක්
කඳුළු සයුරේ අතරමං වෙලා
කඳුලු සතුට උදුරගෙන ගියා...

සෙ/1පේ00614
රසෙ බංඩාර පීකේවස්
1 ශ්‍රීලංරබ

## ආදරණීය අම්මා...

කඳුල රැඳුනු දෑස් අගට
සතුටු කඳුල හරවන්නට
වැල්ලීගෙන ඔබේ අතින්
කිසිවට අත් නොහැර මාව
සෙවනැල්ලක් වලසින් ඔබ
මාගේ මුළු දිවි ගමනම
නොසැලී ඉදිරියටම
වැටුණු සෑම වටකදීම

නොසැලී තව ඉදිරියට
යන්න හයිය ලබාදුන්න
මුළු දිවියම කැපකර ඔබට
ආදරෙයි අහස තරම් අම්මේ...

සෙ/ඊ100400
රෝසෙ කුමාරසිංහ ඩීකේවච්
511 පාබල බසේමු

## තාත්තේ...

වැටෙනා බැහි බිඳු ඉතිරිලා
දකින හැම දේ බොඳවෙලා
මතකේ පමණක් හි වෙලා
ගියේ ඇයි නුඹ හැරදමා...

යැව්වා හරිමග සැමදා
මැව්වා හිතක් දනිත්වා
වරම් ඈ අහිමි වෙලා
ගියේ ඇයි නුඹ හැරදමා...

නුඹේ ගුණ පදකර ගොතන්නට
නොහැක මා හට සුදුසුකම්
හැකියි නම් අද නැවත එනු මැන
ආදරෙයි මේ පණ තරම්...

සෙ/518537
කෝප්‍රල් අමිල කේයූඑම්එච්බිඑ

## නෙතින් කියූ රහසක්...

කටු ඉපල් මත රැඳුනු
නුඹේ පොඩි පා දුටිමි
කලාතුරකින් දකින
සිනාවක් මුව රැඳුනි
සල්පිලක දොරටුවෙන්
සෙව් සළු පිළිවෙලින්
නිරතුරුව ගත වැසුනි
දඟකාර ළමාවිය
සොරුන් ගෙනගොස් තිබුණි
ඔබ දෙවූ රළු වදන්
උනුන් සිත් පාරමින්
උපන් කඳුලක් නෙතින්
සැනින් ඉගිලී වැටුණි
නුඹේ වඩා නෙත් තුලින්
හෙට දිනක මග පෙණුනි
නුඹේ නෙත් යුග තුලින්
මගේ රුව මම දුටිමි

සෙ/330997
ලා/කෝ ජයසිංහ ආර්පීජීච්බී
10 ශ්‍රීලපාහ

## ජීවිතය...

අතු ඉති අග යාන්තමින්
එල්ලීගෙන වතුර බිංදු
ජීවිතයත් නොවේද මෙයට
අනියම් ලොව පෙරලී කරන...

කඳුල රැඳුන දෑස් අගට
රිදුම් දැනෙන හදේ කොතට

වේදනාව නොවේද අපව
ජීවත් කරනා තුන්යම
සියලු දෙයම අතහැර දා
සතුට මෙන්ම කඳුල කැටිව
සදහට සමුගෙන යාමට
ලැබුවේ කුමකටද දිවිය...

සෙ/288136
සංසෙ චතුරංග එන්ටී
6 ශ්‍රීලංසංබ

## අමතක කරන්න බැරි ආදරේ...

අමතක කරන්න බැරි තරම්
මතක ගොඩක් හිතේ පුරවලා
පාලු හිතට දුකක් දීලා යන්න නම්
ඇයිද ඔබ ළංවුණේ
ආදරණීය හිතක් රවටලා...

සෙ/9ඞ01864
කෝප්‍රල් ප්‍රියන්ත කුමාර එම්පී
511 පාබල බසේමු

## අහිමි පෙම...

සිත්පිත් නැති අවියක්
අත දැරුවට
උණුවෙන හදවතක් ඇත
යුධ සෙබළාට
අසරණ මෙමන් හට
ඔබ කරපු වරදට
ගිනිඅවිය වග කියයි
ඔබ දින කෙනාට

සෙ/167764
තුසෙ දිසානායක කේවච්එන්පීකේ
10 ශ්‍රීලකාහ

## ආදරය...

නෙතට වදදෙන හිතට දුක්දෙන
අමතක කර ගැනීමට නොහැකිව ලතවෙන
නුඹට පෙම්බැඳි මගේ ආදරය...

සෙ/533407
පාසෙ වර්ණසූරිය ඩබ්ලිව්එම්එන්එස්පී

## මව් සෙනෙහස...

ඔබේ කුසට මා ආදා සිට පෙම්බර          අම්මේ
මා රැක්කේ ඔබෙ ජීවිතේ දෙවනුව          තබමින්නේ
අගුණයි කියූ කිසිම දෙයක් කුස තුළ දා          ගන්නේ
නැතුව තමයි මා මෙලොවට බිහිකලෙ ඔබ          අම්මේ

ඔබෙ කිරි සුදු දත් ටික ටික කහ පැහැයට          හැරුනා
දෙදනට දික්වී තිබූ කොණ්ඩය ටික ටික          සැලුනා
ඔබේ ගතේ රතු රුහිරය සුදු පැහැයට          හැරුනා
ගෙදර බුදුන් ලෙස බුහුමන් අම්මා නමට          ලැබුණා

සෙ/318945
ලා/කෝ සම්පත් කුමාර ඊවවම්
6 ශ්‍රීලපාහ

## මම ආදරේ කළුවරට...

සෙබළ බිරිඳෑවරු දරාගත් නිසාවෙන්ම
සෙබළුන්ට කැපවීමෙන් රට රැකීමට පුළුවන් විය
සෙබළුන්ට රට වෙනුවෙන් කැපකිරීම නිසාවෙන්ම
සෙබළ බිරින්දෑවරුන්ට දරාගන්න පුළුවන් විය...

කෝ ඉතිං මගේ පුතේ අප්පච්චි දිහා බලන්න
අප්පච්චි ළඟ නැතව දන්නවා බව ඉන්න
තව ටික දවසකින් පුළුවන් මට එන්න
එතකන් අම්මි එක්ක ඔයා පරිස්සමට ඉන්න...

ඔයාලා සඳ එළියට ආදරය කරාට හමුදාවේ
මම ආදරය කරේ කළුවරට
ආලෝකය නිසා යන්න බැරිවුණා ගොඩක් තැන්වලට
මම ගියේ අඳුරින්
හිරු එළියට සඳ එළියට වඩා මගේ ජීවිතේ
බේරුවේ ඝණ කළුවරේ
ඒ නිසාම වෙන්න ඇති අදටත් සඳ එළියට වඩා
මම ආදරේ කළුවරට...

සෙ/378032
කෝප්‍රල් චතුරංග එම්පීසීවස් - 1 විබ

## ජීවිතය, මිනිසා සහ ප්‍රේමය...

ඉකුත් භවයදී පැසක් විලසට
පොදි බැඳන් ආ කුසල අකුසල
පෙරලෙනා කළ ලැබෙන දුක් සැප
විඳී ගෙවනා දනන් ජීවිත...

එකෙක් අනෙකා හඹා යන්නට
පාගලා පොඩිකර දමන්නට
සිනාසෙන්නට උවම් පෑමට
වෙරදරති මිනි සතුන් මිහිකත...

එක හිතක් ලඟ සිනා කැන්දන
තව හිතක් යට කඳුළු වගුරන
දැනෙන විදියට අරුත් ගැන්වෙන
අරුම සිතුවිල්ලකි ප්‍රේමය...

සෙ/604458
ලා/කෝ රත්නායක ආර්එම්එස්බී
1 ශ්‍රීලයුහුබ


කෙළිබිමේ
පෑ විරු හපන්කම්

# ඕස්ට්‍රේලියාවේ රගර් පුහුණුව සඳහා යුද්ධ හමුදා කාන්තා ක්‍රීඩිකාවක් සුදුසුකම් ලබයි





ඕස්ට්‍රේලියාවේ 'Melbourne Rebels' iy 'Rugby Victoria' සමාජ මගින් සංවිධානය කරන ලද සත් සාමාජික රගර් තරගාවලිය CR) FC පිටියේදී පසුගිය අගෝස්තු මස 29 වන දින පැවති අතර, එහි ශූරතාවය හිමිකර ගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා කණ්ඩායම සමත්විය. මෙම තරගාවලිය යුද, නාවික, ගුවන් සහ CR) FC ක්‍රීඩා සමාජය නියෝජනය කරමින් මෙරට ප්‍රමුඛ පෙළේ රගර් කණ්ඩායම් හතරක් ක්‍රීඩා කළහ. තරගාවලිය පැවැත්වීමේ මූලික අභිප්‍රාය වූයේ මෙරට රගර් ක්‍රීඩිකාවන් දෙදෙනකු සඳහා මාස හයක කාලයක් ඕස්ට්‍රේලියාව තුළ පුහුණුවක් ලබාදීමට සහ ඕස්ට්‍රේලියාවේ 'Melbourne Rebels' ක්‍රීඩා සමාජය සඳහා ක්‍රීඩා කිරීමට ශිෂ්‍යත්වයක් ලබාදීමට තෝරා ගැනීමයි.

එහිදී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා රග්බි කණ්ඩායමේ නායක ලාන්ස් කෝප්‍රල් ලියනගේ ඩීසීටී තරගාවලියේ පළමු පෙළ උත්සාහක දිනුම්ලාභියා වූ අතර, ඇය මාස හයක කාලසීමාවක් ඕස්ට්‍රේලියාවේ පුහුණුවීම් සඳහා ශිෂ්‍යත්වයක් හිමිකර ගැනීමට සමත් වූවාය. තරගය නැරඹීම සඳහා යුද්ධ හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පීඒඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඇතුළු යුද්ධ හමුදා රගර් කමිටු සාමාජිකයෝ රැසක් සහභාගී වූහ.

# ජාතික ආධුනික පිරිමි ජූඩෝ ශූරතාවය යුද්ධ හමුදාවට




ඔලිම්පික් ජූඩෝ කමිටුවේ අනුග්‍රාහකත්වය මත ශ්‍රී ලංකා ජූඩෝ සංගමය මගින් සංවිධානය කරනු ලැබූ ජාතික ආධුනික ජූඩෝ ශූරතාවලිය අගෝස්තු මස 27 සිට 29 දින දක්වා පොළොන්නරුව ජාතික ක්‍රීඩා සංකීර්ණයේදී පැවැත්වූ අතර, එහි ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිරිමි ජූඩෝ කණ්ඩායම විසින් හිමිකරගත්හ.

තරගාවලිය සඳහා ජූඩෝ සංගම් 35 ක් නියෝජනය කරමින් ක්‍රීඩකයින් 308 දෙනකු ඉදිරිපත් වූ අතර, එහිදී යුද්ධ හමුදා පිරිමි ජූඩෝ කණ්ඩායම රන් පදක්කම් 06 ක්, රිදී පදක්කම් 06 ක් සහ ලෝකඩ පදක්කම් 05 ක් සමගින් ලකුණු 53 ක් රැස්කරගනිමින් ශූරතාවය හිමිකරගත්හ. රන් 02 ක්, රිදී පදක්කම් 02 ක් සහ ලෝකඩ පදක්කමක් සමගින් ලකුණු 17 හිමිකරගනිමින් අනුශූරතාවය දිනාගැනීමට වික්‍රමබාහු ක්‍රීඩා සමාජය සමත්විය. තරගාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා ජූඩෝ සංගමයේ සභාපති විංග් කමාන්ඩර් මංජුල වීරසිංහ සහභාගී වූ අතර, තරගය නැරඹීම සඳහා නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.



# අන්තර් රෙජිමේන්තු පාපැදි ශූරතාවලිය - 2023



ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව විසින් සංවිධානය කරනු ලැබූ අන්තර් රෙජිමේන්තු පාපැදි ශූරතාවලිය - 2023 ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ ක්‍රීඩිකාවෝ 13 දෙනකු ඇතුළු පාපැදිකරුවෝ 133 දෙනකුගේ සහභාගීත්වයෙන් ඉකුත් සැප්තැම්බර් මස 7 සහ 8 දිනයන්හිදී උඩවලව ප්‍රදේශයේදී පවත්වනු ලැබිය.

එහිදී, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව නියෝජනය කරමින් සහභාගී වූ පාපැදි තරඟකරුවන් ලකුණු 104 ක් ලබාගනිමින් තරඟාවලියේ ශූරතාවයට හිමිකම් කීමට සමත් වූ අතර, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ පාපැදි තරඟකරුවෝ ලකුණු 50ක් ලබාගනිමින් අනුශූරතාවය දිනාගැනීමට සමත් වූහ. අන්තර් රෙජිමේන්තු පාපැදි ශූරතාවලිය - 2023 සඳහා යුද්ධ හමුදා රෙජිමේන්තු 13 ක් නියෝජනය කරමින් පාපැදි ධාවකයෝ සහභාගී වූහ.

තරඟාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අධ්‍යක්ෂ ජෙනරාල් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු සහ යුද්ධ හමුදා පාපැදි කමිටු සභාපති මේජර් ජෙනරාල් ජේජීආර්එස්කේ ජයසේකර යූඑස්පී පීඑස්සී සහභාගී විය. විවිධ කාණ්ඩ සහ නිපුණතා මට්ටම් මෙන්ම වයස් සීමාවන් යටතේ මෙම පාපැදි තරඟාවලිය පවත්වන ලද අතර, එහිදී පිරිමි කාණ්ඩය, කාන්තා කාණ්ඩය, වයස අවුරුදු 50 ට වැඩි කාණ්ඩය, ඒකල සහ කණ්ඩායම් යන ඉසව් තුළින් තරඟාවලිය පැවැත්විණි.

# සමස්ත ලංකා ශක්ති බර ඉසිලීමේ තරඟාවලියේ ජය යුද්ධ හමුදාවට










පසුගියදා පැවැති "සමස්ත ලංකා ශක්ති බර ඉසිලීමේ තරඟාවලියේ" පිරිමි කාණ්ඩයේ සමස්ත ජාතික ශූරතාව දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා බර ඉසිලීමේ ක්‍රීඩකයෝ සමත්වූහ. වාද්දුව විජය කුමාරතුංග ශ්‍රවණාගාරයේදී ඉකුත් සැප්තැම්බර් මස 09 වන දින පැවති මෙම තරඟාවලිය සඳහා තවත් ප්‍රතිවාදී කණ්ඩායම් දහයක් සහභාගී වූහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කිලෝග්‍රෑම් 66, කිලෝග්‍රෑම් 93 සහ කිලෝග්‍රෑම් 120 යන කාණ්ඩ තුළින් රන් පදක්කම් 3 ක් දිනාගැනීමට සමත්විය. තරඟාවලියේ දක්ෂතම බර ඉසිලීමේ ක්‍රීඩකයාට හිමි සම්මානය 6 ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ සැරයන් රාජපක්ෂ ආර්ඩීසීකේ විසින් දිනාගන්නා ලදී.

තරඟාවලියේ කිලෝග්‍රෑම් 105 කාණ්ඩයේ රන් පදක්කම කෝප්‍රල් රත්නායක ආර්එම්එස්එස් හටත්, කිලෝග්‍රෑම් 120 කාණ්ඩයේ රන් පදක්කම් සාමාන්‍ය සෙබළ විමන්ත කේටී හටත් හිමිවිය. තවද, සාමාන්‍ය සෙබළ හෙට්ටිආරච්චි එච්ඒඑස්එස්, ලාන්ස් කෝප්‍රල් ජයරත්න ඩබ්ලිව්වීඑස්සී රිදී පදක්කම් 2 ක් දිනාගත් අතර කෝප්‍රල් රාමනායක ඩීඑස්සී ලෝකඩ පදක්කමක් හිමිකර ගත්තේය.

# කෙළිබිම එකලු කළ ස්වේච්ඡා බලසේනා ක්‍රීඩා උළෙළ













දින තුනක් පුරා පැවති "ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මලල ක්‍රීඩා තරගාවලිය - 2023" ඉකුත් සැප්තැම්බර් මස 21 වන දින දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේදී සාර්ථකව නිමාවට පත්විය. තරගාවලියේදී ක්‍රීඩා ඉසව් 24 ක් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 350 කට අධික සංඛ්‍යාවක් තරග වැදුණු අතර, එහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මලල ක්‍රීඩා තරග වාර්තා රැසක් බිහිවිය.

එහි සම්මාන ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සුරතින් ජයග්‍රාහකයින් වෙත කුසලාන සහ සහතිකපත්‍ර ප්‍රදානය කරනු ලැබිය. තරගාවලියේදී, ස්වේච්ඡා බලසේනා මලල ක්‍රීඩා වාර්තා එකොළහක් බිහිකරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ තම විශිෂ්ට කුසලතා ප්‍රදර්ශනය කළහ. තූර්ය වාදක සහ සංස්කෘතික කණ්ඩායම්වල සංදර්ශනයන්ගෙන් සමාප්ති දින උත්සවය වඩාත් වර්ණවත් කෙරිණි.

මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ටීකේආර් සිල්වා කේඑස්පී, යුද්ධ හමුදා හටකාර්ය සම්පාදන මූලස්ථානයේ ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී, ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, ආර්සීඩීසී, පීඑස්සී ජාතික මලල ක්‍රීඩා සම්මේලනයේ නියෝජිතයින් ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ.

# රණවිරු සංගම් සුහද හමුව





දිවයින පුරා විසිරී සිටින විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින් හා මියගිය අයවලුන්ගේ ළඟම ඥාතීන් ආසේමු බලප්‍රදේශ යටතේ දිස්ත්‍රික් වශයෙන් සංවිධානය කොට දිස්ත්‍රික් රණවිරු සංවිධාන ආරම්භ කිරීමට රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධතාවයෙන් යුතුව පියවර ගෙන ඇත. යුද්ධ හමුදාධිපති ගේ මාහැඟි අදහසකට අනුව ක්‍රියාත්මක මෙම කටයුත්තෙහි අරමුණ ශ්‍රී ලංකාවේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් උතුම් මෙහෙවරක් කොට මියගිය යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ළඟම ඥාතීන් හා විශ්‍රාම ගොස් සිටින යුද්ධ හමුදා සාමාජිකයින් හට අභිමානවත් ලෙස නිසි ගෞරවයක් හා පිළිගැනීමක් සහිතව ජීවත්වීම සඳහා අවකාශය හා පරිසරය සැලසීමයි.

ඒ යටතේ ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ට අයත් මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කයන්හි රණවිරු සංවිධානවල විධායක කමිටු රැස්වීම රණවිරු සේවා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩීසීසීඩීආර් වෛද්‍යසේකර ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් 2023 ජූලි මස 28 වන දින 2 (ස්වෙච්ඡා) බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මූලස්ථානය මහනුවරදී පැවැත්විණ.

ඒ සඳහා එම සංගමේ සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික තනතුරු හොබවන විශ්‍රාමික නිලධාරීන්/සෙසුනිලයන් මෙන්ම දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීහු සහභාගී වූහ. එහිදී, එම රණවිරු සංවිධානයන්හි ඉදිරි අරමුණු හා ඉලක්ක සපුරාගන්නා ආකාරය පිළිබඳව සාකච්ඡා කෙරුණු අතර, එම හමුවේදී රණවිරු සේවා අධ්‍යක්ෂ විසින් එම රණවිරු සංවිධානයන්හි පවතින ගැටලු සඳහා විසඳුම් ලබාදෙමින් ඉදිරි සැලසුම් සාර්ථක කරගැනීමට අවශ්‍ය උපදෙස්ද ලබාදෙන ලදී.

යුද්මය හේතුන් මත තුවාල ලැබූ රණවිරුවන්ට සහ මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් හට ලබාදී ඇති දඹුල්ල දිගම්පතහ ඉඩම රණවිරු සේවා අධ්‍යක්ෂ විසින් අධීක්ෂණය කිරීමද ඉහත වැඩසටහනට සමගාමීව සිදුකෙරුණු අතර, ඒ සඳහා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල නියෝජිතයින් හා ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිනියද සහභාගී වූහ.


# රණවිරුවා





**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ආර්එම්එච්පීකේ රත්නායක



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්එල්පු ලක්ෂිකා

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බනි II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්නිලීණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධන

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුහ දිගුව**

51445/51446

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



# දෙපයේ සවියෙන් ලෝක වාර්තා අතරට

ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) බලප්‍රදේශයේ ස්ථාපිත 3 වන ශ්‍රී ලංකා සංඥා බලකායට අයත් මාණ්ඩලික සැරයන් කීර්තිරත්න කේඅයිවිඑස් යාපනය පේදුරුතුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා කිලෝමීටර 580.61 ක දුරක් පාගමනින් පැමිණෙමින් ලෝක වාර්තාවක් තැබිය. ඉකුත් සැප්තැම්බර් 05 වන දින පේදුරුතුඩුවෙන් ආරම්භ කරනු ලැබූ එම පා ගමන ඉකුත් සැප්තැම්බර් 16 වන දින උදෑසන දෙවුන්දරතුඩුවෙන් සාර්ථකව නිමාකරන ලද්දේ සෙරන්ඩිබ් ලෝක වාර්තා කමිටුවේ නියෝජිත සාමාජිකයින් අතින් නව සෙරන්ඩිබ් ලෝක වාර්තා සඳහා වූ සහතිකය හිමිකර ගනිමිනි.

මෙම රණවිරුවාගේ උත්සාහය හා කැපවීම මුලසිට යුද්ධ හමුදාධිපතිගේද අවධානයට ලක්ව තිබූ අතර, ඒ අනුව ඔහුට මෙම ලෝක වාර්තාව පිහිටුවීම සඳහා අවැසි සියලු පහසුකම් හා පසුබිම යුද්ධ හමුදාධිපතිතුමන්ගේ උපදෙස් හා මගපෙන්වීම මත සැපයිණ. ඒ අනුව මාණ්ඩලික සැරයන් කීර්තිරත්න කේඅයිවිඑස් ගේ ලෝක වාර්තා පාගමන කිලිනොච්චිය, වව්නියාව, මැදවච්චිය, අනුරාධපුරය, කුරුණෑගල, කොළඹ, අලුත්ගම, ගාල්ල සහ මාතර යන දිස්ත්‍රික්ක පසුකරමින් දින 12 කට පසු දෙවුන්දරතුඩුවෙන් අවසන් කෙරිණ. ඉඳිරි නඩත්තු පෙදෙස (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්පීපී දසනායක, ශ්‍රී ලංකා සංඥා බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ඒකේඩී අධිකාරි යූඑස්පී, 3 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් මාණ්ඩලික සැරයන් කීර්තිරත්න වෙත සුභ පැතුම් පිරිනැමීම සඳහා දෙවුන්දර ශ්‍රී විෂ්ණු මහා දේවාල පරිශ්‍රය වෙත පැමිණ සිටියහ.








# "විකුම්පුර" සිනහව

එවක පැවති ත්‍රස්තවාදය හේතුවෙන් උන්හිටිතැන් අහිමි වූ මන්නාරම ප්‍රදේශයේ සිංහල වැසියන් රැසකට යලි සෙවණ දුන් ක්ෂේම භූමිය වූයේ විකුම්පුර ග්‍රාමයයි. තම උපන් ගම්බිම් සේම උපයා සපයාගත් සියලු වස්තුවද හැරදමා යුද්ධයේ ගොදුරු බවට පත්ව අනුරාධපුරයේ අනාථ කඳවුරක දිවි ගෙවූ එම පිරිසට පිළිසරණ වූයේ එවක 542 වන බලසේනාවේ බළසේනාධිපති වූ කර්නල් විකුම් ලියනගේය. (වත්මන් යුද්ධ හමුදාධිපති) යුද්ධය අවසන්ව වසර කිහිපයක් ගෙවන්නටත් මත්තෙන් එම පිරිස වෙනුවෙන් ඔවුනට හුරුපුරුදු පරිසරයේම ස්ථිර බිම්කඩක් උරුමකර දෙන්නට රාජ්‍ය නිලධාරීන්ගේද සහාය ඇතිව එතුමන් ගත් උත්සාහයේ ප්‍රතිඵලය නම් මන්නාරම ප්‍රදේශයේ "නරිකාඩු" ග්‍රාමයේ ඔවුන් සඳහා වෙන්වීමය.

මුඩු බිමක්ව තිබූ එම භූමිය බොහෝ දුෂ්කර වෑයමකින් පසුව සංවර්ධනය කොට එම පිරිස පදිංචි කරවා ඔවුනට අවශ්‍ය නිවාස අත්‍යවශ්‍ය භාණ්ඩ සේම යටිතල පහසුකම්ද සපුරාදීමට එවක ප්‍රදේශයේ බලසේනාධිපතිවරයා ලෙස වත්මන් යුද්ධ හමුදාධිපති සිදුකළ කාර්යභාරය එම ජන හදවත් තුළ සදාතනිකව නිදන්ගත වී ඇත. පසුකාලීනව එම නරිකාඩු ග්‍රාමයේ එම ප්‍රදේශය එහි ජනතාවගේ බලවත් ඉල්ලීම මත "විකුම්පුර" ලෙස පරිවර්තනය වූයේද වත්මන් යුද හමුදාධිපතිගේ නමට කෙරෙන කෘතගුණ සැලකීමක් ලෙසය. එහි පදිංචි මේ අනාගත උරුමකරුවන්ගේ සුන්දර සිනහවෙන් අදටද ගම්‍යවනුයේ ඔවුනට පය ගසන්නට බිමක් උරුම වූ සතුට නොවේද?